| එම | වෙට්ටන්කුලම, ටී. ඒ. ඩිංගිරිබණ්ඩාගේ නිවස අසලදී | 1970. 6.17 සිට 70. 6.18 දක්වා | එම |
| එම | හම්මිල්කුලම, ආර්. බණ්ඩියාගේ නිවස අසලදී | 1970. 6.20 සිට 70. 6.21 දක්වා | එම |
| එම | පලයාකුලම, කේ. ඇම්. කපුරු බණ්ඩාගේ නිවස අසලදී | 1970. 6.22 සිට 70. 6.23 දක්වා | එම |
| එම | ඉහළකෝන්ගස්වැව, ආර්. සුන්දරාගේ නිවස අසලදී | 1970. 6.24 සිට 70. 6.25 දක්වා | එම |
| එම | පහළකෝන්ගස්වැව, ඇම්. සාපින්ගේ නිවස අසලදී | 1970. 6.28 සිට 70. 6.29 දක්වා | එම |
| 43 තුලාන | ආලිත්තාන, ග්‍රාම සේවක කාර්යාලය අසලදී | 1970. 6.10 සිට 70. 6.11 දක්වා | එම |
| 43 තුලාන | උළගල්ල, වැව අසලදී | 1970. 6.14 සිට 70. 6.15 දක්වා | එම |
| එම | දිවුල්වැව, වැව අසලදී | 1970. 6.17 සිට 70. 6.18 දක්වා | එම |
| එම | මානක්කුලම, වැව අසලදී | 1970. 6.20 සිට 70. 6.21 දක්වා | එම |
| එම | කරඹෑගම, වැව අසලදී | 1970. 6.22 සිට 70. 6.23 දක්වා | එම |
| එම | රදාරඹෑවැව, වැව අසලදී | 1970. 6.24 සිට | එම |
| එම | කුඩාකණුමුල්ල, තිස්බඹය අසලදී | 1970. 6.27 සිට 70. 6.28 දක්වා | එම |
| 43 ඒ තුලාන | අලගොල්ලැව, පල්ලිය අසලදී | 1970. 6. 1 සිට 70. 6. 3 දක්වා | එම |
| එම | මුරියාකඩවල, ග්‍රාම සේවක කාර්යාලය අසලදී | 1970. 6. 5 සිට 70. 6. 7 දක්වා | එම |
| එම | ඌත්තුපිටිය, ඌත්තුපිටිය හන්දිය අසලදී | 1970. 6. 8 සිට 70. 6.10 දක්වා | එම |
| එම | බමුණුගම, බමුණුගම හන්දිය අසලදී | 1970. 6.11 සිට 70. 6.14 දක්වා | එම |
| එම | අම්නිච්චිය, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 6.15 සිට 70. 6.17 දක්වා | එම |
| එම | පහළ අඹතලේ, පාසැල අසලදී | 1970. 6.18 සිට 70. 6.21 දක්වා | එම |
| එම | ඉහල අඹතලේ, ප්‍රේමරත්න මුදලාලිගේ නිවස අසලදී | 1970. 6.22 සිට 70. 6.23 දක්වා | එම |
| එම | පණ්ඩිතරඹෑව, වැව අසලදී | 1970. 6.24 සිට 70. 6.27 දක්වා | එම |
| 43 බී තුලාන | ලබුනෝරුව, පොදු ගවගාල අසලදී | 1970. 7. 4 සිට 70. 7. 7 දක්වා | එම |
| එම | සන්දනන්කුලම, ගම්සභා නියෝජිත මහතාගේ නිවස අසලදී | 1970. 7. 8 සිට 70. 7.10 දක්වා | එම |
| එම | කට්ටමුරිච්චාන, ග්‍රාම සේවක කාර්යාලය අසලදී | 1970. 7.12 සිට 70. 7.14 දක්වා | එම |
| එම | මීවැල්ලැව, වාරිමාර්ග නියෝජිත මහතාගේ නිවස අසලදී | 1970. 7.15 සිට 70. 7.17 දක්වා | එම |
| එම | තිනිපිටිගම, දේවාලය අසලදී | 1970. 7.19 සිට 70. 7.24 දක්වා | එම |
| 44 තුලාන | නාවක්කුලම, රජයේ පාසැල අසලදී | 1970. 6.14 සිට 70. 6.15 දක්වා | එම |
| එම | අමුණුකොලේ, පේමසිරිගේ කඩේ අසලදී | 1970. 6.16 සිට | එම |
| එම | මොරගොඩ, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 6.20 සිට | එම |
| එම | උනගොල්ලැව. වාරිමාර්ග නියෝජිත මහතාගේ නිවස අසලදී | 1970. 6.21 | එම |
| එම | බැදිවැව, රජයේ පාසැල අසලදී | 1970. 6.23 සිට 70. 6.24 දක්වා | එම |
| එම | මහදිවුල්වැව, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 6.28 සිට 70. 6.29 දක්වා | එම |
| එම | කළුඑබේ, රජයේ පාසැල අසලදී | 1970. 7. 5 සිට 70. 7. 6 දක්වා | එම |
| එම | කිරියගස්වැව, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7. 7 | එම |
| එම | එප්පාවල, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7. 9 | එම |
| එම | හබදිවුල්වැව, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7.12 | එම |
| එම | සියඹළාදමන, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7.13 | එම |
| 44 ඒ තුලාන | කලුගොල්ලාගම, වාන අසලදී | 1970. 6. 1 සිට 70. 6. 2 දක්වා | එම |
| එම | ඉලිප්පුකන්නිය, වාන අසලදී | 1970. 6. 5 සිට 70. 6. 6 දක්වා | එම |
| එම | හුරුළුයකල්ල, රෙදි මෝල අසලදී | 1970. 6. 9 සිට 70. 6.10 දක්වා | එම |
| එම | යකල්ල, වාන අසලදී | 1970. 6. 8 සිට 70. 6. 7 දක්වා | එම |
| එම | හුරුළුකටුකැලියාව, හන්දිය අසලදී | 1970. 6.13 සිට 70. 6.14 දක්වා | එම |
| එම | හුරුළුමීගස්පට්ටිය, පාසැල අසලදී | 1970. 6.15 සිට 70. 6.16 දක්වා | එම |
| එම | හුරුළුදඹගහඋල්පත පාසැල අසලදී | 1970. 6.17 සිට 70. 6.18 දක්වා | එම |

| ග්‍රාමසේවක කොට්ඨාශය | නිවරණ කරන ස්ථානය | දිනය | වේලාව |
|---|---|---|---|
| 44 ඒ තුලාන | හුරුළු මහරඹෑව, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 6.20 සිට 70. 6.21 දක්වා | පෙ. ව. 8.30 සිට 4.30 දක්ව |
| එම | හුරුළුවැව ඇල්. බී. ජනපදය, හන්දිය අසලදී | 1970. 6.22 සිට 70. 6.23 දක්වා | එම |
| එම | මරදන්කල්ල, පාසැල අසලදී | 1970. 6.24 සිට 70. 6.25 දක්වා | එම |
| එම | හු./එප්පාවල, පාසැල අසලදී | 1970. 6.24 සිට 70. 6.25 දක්වා | එම |
| 45 තුලාන | පුස්දිවුල්වැව, පාසැල අසලදී | 1970. 7. 4 | එම |
| එම | මහමීගස්වැව, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7. 6 | එම |
| එම | මඩවල, තැපැල් කාර්යාලය අසලදී | 1970. 7. 8 | එම |
| එම | හම්මිල්ලෑව, පාසැල අසලදී | 1970. 7. 9 | එම |
| එම | මහරඹෑව, පාසැල අසලදී | 1970. 7.12 | එම |
| එම | තෙල්හවඩියාව, ගො.කා.ස. මණ්ඩලයේ සභාපතිගේ නිවස අසලදී | 1970. 7.14 | එම |
| එම | පඩිකාරමඩුවගම, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7.16 | එම |
| එම | නුවරඑළිය කොළනිය, ඩබ්.එම්.එම්. වන්නකුරාළගේ නිවස අසලදී | 1970. 7.17 | එම |
| එම | පඩිකාරමඩුව ලහ කොළණිය, පී. ජී. මුදලිහාමි මහතාගේ නිවස ලහදී | 1970. 7.19 | එම |
| එම | නුවරගම්කොළණිය, ග්‍රාම සේවක කාර්යාලය අසලදී | 1970. 7.21 | එම |
| එම | මහරඹෑකොළණිය, තැපල් කාර්යාලය අසලදී | 1970. 7.22 | එම |
| එම | කුරුණෑගල කොළණිය, එච්. ඒ. ඇම්. උක්කුබණ්ඩාගේ නිවස අසලදී | 1970. 7.24 | එම |
| එම | එම ... කුඩාගලෙන්බිදුනවැව කොළණිය, කේ. හේරත්හාමි මහතාගේ නිවස අසලදී | 1970. 7.27 | එම |
| 46 තුලාන | ගලපිටගල, හතර මං හන්දියේ දී | 1970. 6. 1 සිට 70. 6. 3 දක්වා | එම |
| එම | සේනාදිරියාගම, ග්‍රාම සේවක, කාර්යාලය අසලදී | 1970. 6. 5 සිට 1970. 6. 7 දක්වා | එම |
| එම | හොරිවිල, හතර මං හන්දියේදී | 1970. 6. 8 සිට 70. 6.11 දක්වා | එම |
| එම | උල්පත, වැව් බැම්ම අසලදී | 1970. 6.11 සිට 70. 6.14 දක්වා | එම |
| එම | පලුගස්වැව, හන්දිය අසලදී | 1970. 6.15 සිට 70. 6.18 දක්වා | එම |
| එම | වේරගල, හන්දිය අසල දී | 1970. 6.20 සිට 70. 6.23 දක්වා | එම |
| එම | ගල්කඩවල, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 6.24 සිට 70. 6.27 දක්වා | එම |
| එම | දෙමුන්නෑව, පාසැල අසලදී | 1970. 6.28 සිට 70. 6.30 දක්වා | එම |
| එම | කැලෑව, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7. 1 සිට 70. 7. 5 දක්වා | එම |
| එම | වැල්පොත, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7. 6 සිට 70. 7. 9 දක්වා | එම |
| එම | උඩකඩවල, වාරිමාර්ග නියෝජිතතැනගේ නිවස අසලදී | 1970. 7.10 සිට 70. 7.13 දක්වා | එම |
| 46 ඒ'' | ගිරිවඩුන්න, පාසැල අසලදී | 1970. 6.15 සිට 70. 6.16 දක්වා | එම |
| එම | පුවක්පිටිය, පාසැල අසලදී | 1970. 6.21 සිට 70. 6.22 දක්වා | එම |
| එම | හබරණගම, වාරිමාර්ග නියෝජිතගේ නිවස අසලදී | 1970. 6.26 සිට 70. 6.30 දක්වා | එම |
| එම | කුඩාරඹෑවැව, වාරිමාර්ග නියෝජිතගේ නිවස අසලදී | 1970. 7.14 සිට 70. 7.15 දක්වා | එම |
| එම | කුඹුක්වැව, පාසැල අසලදී | 1970. 7. 9 සිට 70. 7.10 දක්වා | එම |
| එම | හබරණ කඩවීදිය, ග්‍රාම සේවක කාර්යාලය අසලදී | 1970. 7.22 සිට 70. 7.23 දක්වා | එම |

4—479

# "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම්

එල්. ඩී.—බී. 28/38 ඊ. සි. අල්ඒ/ඒ/80

## 1970–71 වර්ෂය සඳහා වූ හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි

වර්ෂ 1970 ඔක්තෝබර් මස 1 වෙනි දිනෙන් පටන් ගෙන 1971 සැප්තැම්බර් මස 30 වෙනි දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය තුළ දී හා ඊට පසු කාල සීමාවන් තුල දී ප්‍රාදේශීය ප්‍රදේශයේ සිල්ලරට අරක්කු විකිණීමේ තනි අයිතිය, ප්‍රදනය කිරීම තවදුරටත් නිවේදනය කරන තුරු—

(1) සෑම සුරාබදු බලපත්‍රයකටම අදළ එවකට වලංගුව පවත්නා පොදු කොන්දේසි, හා

(2) මෙහි පහත දක්වා ඇති විශේෂ කොන්දේසිවලට ද යටත්විය යුතුයයි (52 වෙනි අධිකාරය වන) සුරාබදු ආඥපනතේ 19 වෙනි වගන්තිය යෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සුරාබදු කොමසාරිස් මුතුබණ්ඩා දිසානායක වන මම, ස්වදේශ කටයුතු භාර ඇමැති වරයාගේ ද අනුමැතිය ඇතිව මෙයින් නියම කරමි.

මු. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970 අප්‍රියෙල් 4 වැනි දින,
කොළඹ, සුරාබදු කොමසාරිස් කාර්යාලයේදීය.

### විශේෂ කොන්දේසි

**1.** වෙන යම්කිසි තැනැත්තකු විසින් (රටබීම බලපත්‍රයක් දරන්නෙකු හෝ නොඑසේමුක්) විකිණීමට අදලව තනි බලය ප්‍රදනය කිරීම (28 වෙනි කොන්දේසියත් බලන්න). වෙනත් අයෙකු (රටබීම බලපත්‍රයක් දරන්නකු හෝ නො එසේ හෝ) විසින් බලපත්‍රයක් මාර්ගයෙන් විධිමත් ලෙස අවසරය ලැබ, පදම් කළ අරක්කු හැර, තනිබලය ලත් තනැත්තාගේ තැබෑරුමෙන් පමණක් ගත් අනික් අරක්කු, එම තැබෑරුමට අයත් ප්‍රදේශයෙම පිහිටි විදේශීය මත්පැන් විකිණීමට බලපත්‍ර ලත් ස්ථානයක හෝ නිශ්චිත වෙනත් ස්ථානයක හෝ විකිණීමේ අයිතියට යටත්ව, පදම් කළ අරක්කු හැර තොග වශයෙන් හෝ සීල් බෝතල් වශයෙන් හෝ ගත් අනික් අරක්කු විකිණීමේ බලය හුදෙක් ම තනි බලයක් වන්නේය. කෙසේ වෙතත් විධිමත් ලෙස අනුමත කරනු ලැබූ ස්ථානයක පදම් කළ අරක්කු සෑදීමටත් එම පදම් කළ අරක්කු එම ස්ථානයේදීම තොග වශයෙන් විකිණීමටත් කිසිවෙකුට බලපත්‍ර යක් දී තිබෙ නම් ඔහුට වෙන කිසිම ස්ථානයක නොව බලපත්‍ර ලත් එම ස්ථානයේ දීම පමණක් සාදන ලද පදම් කළ අරක්කු, අරක්කු සිල්ලරට විකිණීම සඳහා විධිමත් ලෙස බලපත්‍ර ලබා ඇති විදෙශීය මත්පැන් බලපත්‍ර ධාරින්ට කෙළින් ම විකිණීමට පිළිවන.

**2. (1) තනි බලය පිළිබඳ කාල පරිච්ඡේදය.**—මේ තනි බලය දෙනු ලබන්නේ යම්කිසි අවුරුද්දක ඔක්තෝබර් මස 1 වෙනි දිනෙන් පටන්ගෙන ඊළඟ අවුරුද්දේ සැප්තැම්බර් මස 30 වෙනි දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා, නියමිත ආකෘති පත්‍රයක් මගින් ටෙන්ඩර් ස්වරූපයෙන් ඉල්ලීමක් කිරීමෙන් හෝ මෙම කොන්දේසිවල සඳහන් වෙනත් අන් ක්‍රමයක් අනුව ඉල්ලුම් කිරීමෙනි.

**(2) තනි බලය දෙනු ලබන ප්‍රදේශ.**—රජයේ දිසාපති විසින් තීරණය කරනු ලබන පරිදි, යම්කිසි තනි තැබෑරුමකට අයත් ප්‍රාදේශීය කොට්ඨාශ යක් සඳහා මෙම තනි බලය දිය හැක.

**3. ටෙන්ඩර් ආකෘති පත්‍ර.**—සෑම ටෙන්ඩරයක්ම මෙම කොන්දේසි වලින් නියමිත ආකෘති පත්‍රයෙහි ලියා එවිය යුතුය. විකුණුම් දැන්වීමේ සඳහන් කාර්යාලවලින් මේ ආකෘති පත්‍ර ලබා ගත හැක. 6 (2) වැනි කොන්දේසිය යටතේ සුදුසුකම් නැති සීමාසහිත සමාගම්වලට, තමන් සුදුසු බවට ලියකියවිලි ඉදිරිපත් කරන තුරු, ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ.

**4. ටෙන්ඩරය පිළිබඳ තැන්පත් කිරීම සහ වටිනාකම් සහතිකය**

(1) අවශ්‍ය යයි පෙනී ගියහොත්, එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් ටෙන්ඩර්කාරයා විසින් රුපියල් පන්දහකට (රු. 5,000) වැඩි නොවන මුදලක්, තැන්පත් කළ යුතු යයි රජයේ දිසාපති විසින් නියම කළ හැක. එය ද මුදලින් හෝ බැංකුවක් විසින් ''ගෙවීම සඳහාය'' යි ලකුණු කරන ලද චැක් පතකින් හෝ ලංකා බැංකු වෙන් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂා චෙක්'' යන ස්වරූප යෙන් නිකුත් කරන ලද චැක් පතකින් හෝ බැංකුවකින්, ඒ බැංකු වේ ම නමට ලියන ලද චැක් පතකින් හෝ තැන්පත් කර තැබිය යුතුය.

(2) මේ කොන්දේසියේ පූර්වෝක්ත ඡෙදය යටතේ, රජයේ දිසාපති විසින් නියම කරන මුදල් තැන්පත් කළ බවට, කච්චේරි කුවිතාන්සියක් සෑම ටෙන්ඩර් පත්‍රයකට ම අමුණා එවිය යුතුය. කුවිතාන්සි අංකය සහ දිනය, ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුය.

(3) (i) සෑම ටෙන්ඩර් පත්‍රයකටම, ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශිය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයක මුල් පිටපත ද අමුණා තිබිය යුතු අතර එක් තැබෑරුමකට වැඩියෙන් ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල, මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි පිටපත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතු ය.

වත්කම් සහතිකයක් සමඟ එවා නැති ඕනෑම ටැන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කළ යුතුය. ටැන්ඩරයක සඳහන් වටිනාකමින් සියයට විසිපහකට අඩු යම් වටිනාකමක් සඳහා වූ වත්කම් සහතිකයක් සමඟ එවූ ටැන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කළ යුතුය. එසේ වුවද රජයේ දිසාපති විසින් තම අභිමතය පරිදි, පැන නැගී ඇති කරුණු අනුව, සුදුසුයයි කල්පනා කරතහොත් මුළු වටිනාකම ටැන්ඩරයේ වටිනාකමින් සියයට විසිපහකට නොඅඩු ගණනකට ගෙන එනු පිණිස රේන්ද විකුණූ දිනට පසු දින ප.ව. 4.00ට පෙර අතිරේක වත්කම් සහතිකයක් ඉදිරිපත් කිරීමට එවැනි ටැන්ඩර්කරුවකුට ඉඩදිය හැකිය. ටැන්ඩරයේ 6(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ලබන සීමා සහිත වගකීමෙන් යුත් සමාගමකින් ඉදිරිපත් කරනු ලබන යම් ටැන්ඩරයක්, ඒවැනි ටැන්ඩරයක් සමඟ එවා ඇති එවැනි සමාගමක නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ වත්කම් සහතිකයෙහි වටිනාකම, එවැනි ටැන්ඩරයකින් සියයට දහයකට නොඅඩු නම්, පිළිගත හැකිය. (එක දිස්ත්‍රික්කයක හෝ දිස්ත්‍රික්ක කීපයක තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේ දීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල්, පිටපත අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩරවලට එම සහතිකයේ සහතික පිටපත් අමුනා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදල තැබෑරුමේ නම, අංකය සහ එය පිහිටි දිස්ත්‍රික්කය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතු ය. තම ටෙන්ඩර් පත්‍රය සමග වත්කම් සහතිකයේ සහතික පිටපතක් ඉදිරිපත් කරන ටෙන්ඩර් කරුවෙකු විසින් ඉදිරිපත් කරනු ලැබූ තම ටැන්ඩර් පත්‍රය පිළිගත හොත්, ඔහුට තනි බලය දීම අනිකුත් කරුණු අතර, දිසාපති විසින් මුල් සහතිකය හා සසඳා බැලීමෙන් තහවුරු කල යුතුවූ එම වත්කම් සහතික පිටපතේ නිරවද්‍යතාවය මත රඳා පැවතිය යුතුය).

(ii) මුල් වත්කම් සහතිකය හෝ එහි සත්‍ය පිටපත ඉදිරිපත් කොට ඇති දිසාපතිගෙන් ලිඛිත අවසරයක් ලබා ගතහොත් මිස හෝ එසේ ලැබෙන තුරු ටෙන්ඩර් කරුවකු සඳහා වත්කම් සහතිකයක් නිකුත් කිරීම පිණිස ප්‍රාදේශීය ආදයම් නිළධරයාට පෙන්නුම් කරනු ලැබූ දේපළ අන්සතු කිරීම, විකිණීම හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීම නොකළ යුතු ය. එවැනි අවසරයක් දෙනු ලබන්නේ මුල් සහතිකය (හෝ සහතික පිටපත) ඉදිරිපත් කළ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් වරප්‍රසාද ලාභියා විසින් ලංකා රජයට ගෙවිය යුතු සියළුම ණය සහ වෙනත් ගෙවීම් සම්පූර්ණ වශයෙන් ම පියවා ඇතැයි රජයේ දිසාපති සෑහීමට පත් වූවහොත් පමණකි.

(iii) ඉහතකී කොන්දේසිය කඩ කිරීමක් වූවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට යටත් විය යුතුය.

**5. නියෝජිතයින් ලවා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම හෝ එක් අයෙකු ටෙන්ඩර් පත්‍ර එකකට වඩා හෝ ඉදිරිපත් කිරීම තහනම් බව.—**

(1) සෑම ටෙන්ඩර් පත්‍රයක්ම, ඉදිරිපත් කළ යුත්තේ ඒ ටෙන්ඩර් කරුගේම නමිනි. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයක් භාරගනු නොලැබේ.

(2) යම් කිසි එක් තැබෑරුමක් සඳහා එක් තැනැත්තකු විසින් එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා නොඑවිය යුතුය.

(3) යම් කිසි එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි දෙනෙකු හවුලේ ටෙන්ඩර් ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

**6. ටෙන්ඩර් භාරගැනීමට ඇති නුසුදුසුකම් ; භාරගැනීම නිෂ්ප්‍රභ බව හා බල රහිත බව—**

පහත සඳහන් කිසිම තැනැත්තකුගෙන් ටෙන්ඩර් භාරගනු නොලැබේ :—

(අ) ලංකා පුරවැසියෙකු නොවන්නෙකු ; හෝ

(ආ) පිරිමියෙකු නොවන්නෙකු ; හෝ

(ඇ) දැනට වලංගු වන වාරයේ සහල් සලාක පොතක් අයිති නොවූවෙකු හෝ

(ඈ) අවුරුදු 21ට අඩු වයස් වූවකු ; හෝ

(ඉ) කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවෙකු හෝ කවර අන්දමේ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධයෙන් නීතිය පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයේ හෝ වෙනත් හේතූන් නිසා රජයේ කවර රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් හෝ පිළිබඳ කිසිම කටයුත්තකට මැදිහත් වීමට තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ හෝ නම සඳහන් වන්නා වූ කෙනෙකු ; හෝ

(ඊ) සුරාබදු බලපත්‍ර දැරීම හෝ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ සේවය ලබා ගැනීම හෝ තහනම් කර ඇති අය බවට, සුරාබදු කොමසාරිස් ළඟ තබාගෙන ඇති ලේඛනයේ නම් සඳහන් වන්නා වූ කෙනෙකු ; හෝ

(උ) අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන අයුරු, අපරාධ කාරයෙකු වන්නා වූ කෙනෙකු ; හෝ

(ඌ) සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක්, අවලංගු කරනු ලැබූවකු ; හෝ

(එ) අරක්කු බෝතල පිරවීම සඳහා රජය සමග කොන්ත්‍රාත්තුවක් දරන්නකු ; හෝ

(ඒ) අරක්කු පදම් කිරීමට හා තොග වශයෙන් විකිණීමට බලපත්‍රයක් දරන්නකු ; හෝ

(ඔ) සුරාබදු ආඥාපනත යටතේ යම් වරදක් කර, තුන් වතාවකට වඩා වැඩි වාර ගණනක් වරදකරුවූවෙකු ; හෝ

(ඕ) මේ තනි බලය ආරම්භ වන දිනට කලින් වූ දෑවුරුද්ද තුළ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු වූ කෙනෙක් ය.

එසේ වුවද ඉහත (ඇ) ඡේදයේ සඳහන් පරිදි සහල් සළාක පොතක් අහිමි තැනැත්තෙකු සම්බන්ධයෙන් වූ කල්හි, ඔහු විසින් සිය ස්ථිර ලිපිනය දක්වෙන සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම සේවකගෙන් ලබා ගැනීමෙන් පසු එය ප්‍රාදේශීය ආදයම් නිලධාරි ලවා අනු අත්සන් තබවා ඉදිරිපත් කළහොත් එවැනි තැනැත්තකුගේ ටෙන්ඩර් පත්‍රය දිසාපති විසින් භාරගත හැකිය.

(2) (අ) ලංකාවේ ලියා පදිංචි නොකළ ; හෝ

(ආ) රුපියල් 1,000,000 කට වඩා අඩු නිකුත්කළ මූලික ධනයක් ඇත්තාවූ ; හෝ

(ඇ) සමාගමේ සියලුම කොටස්කරුවන් ලාංකිකයන් නොවන්නා වූ ; හෝ

(ඈ) ලංකාවේ ලියාපදිංචි කාර්යාලයක් නොමැත්තාවූ ; හෝ සීමා සහිත සමාගම මගින් ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

(3) එබඳු අයෙකුගේ යම් ටෙන්ඩරයක් භාරගෙන තිබුණේ වී නමුදු කවර අවස්ථාවක දී හෝ ඒ භාරගැනීම, රජයේ දිසාපතිට හුදෙක් සිය අභිමතය පරිදි, අවලංගු කළ හැක. එ විට, ඒ බව ඔහු විසින් බලපත්‍ර ලාභියාට දන්වනු ලැබේ. අවලංගු කළ බවට එබඳු යම්කිසි නියෝගයක් කළ විට, මුලින් කළ භාරගැනීම නිෂ්ප්‍රභ වී බලරහිත වන්නේය. එබඳු අවලංගු කිරීමක් නිසා ටෙන්ඩර්කරුට රජයෙන් කිසිම අලාභයක් අය කර ගැනීමට අයිතිවාසිකමක් නැත. තවද 10 වෙනි කොන්දේසියේ කුමක් සඳහන් වී තිබුනත්, එකී අය විසින්, 4 වැනි කොන්දේසිය යටතේ තබන ලද ආධානයක් හෝ 9(1) (අ) වැනි කොන්දේසිය යටතේ තබන ලද ඇප ආධානයක් හෝ එකී ආධානය හා ඇප ආධානය යන දෙක ම හෝ, රජයේ දිසාපති විසින් සිය අභිමතය පරිදි රාජසන්තක කරනු ලැබිය හැකි ය.

**7. ටෙන්ඩර් පත්‍ර භාරදීම.**—(1) සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුන් වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලබන තැබෑරුමේ නම ද, ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමේ දක්වෙන පරිදි, ටෙන්ඩර් එවනු ලබන තැබෑරුම, අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුවේ දී ඇති අංකය සහ නම ද පැහැදිලිව ලිවිය යුතුය.

(2) ටෙන්ඩරයක් බහා ඇත්තාවූද, මුද්‍රා තබන ලද්ද වූද, සෑම කවරයක්ම ටෙන්ඩර් බාරගැනීමට නියමිත වේලාව ඉකුත් වීමට කලින්—

(අ) කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය ; නැතහොත්

(ආ) ටෙන්ඩර් වැසීමට නියමිත වේලාව ඉකුත් වීමට කලින් කච්චේරිය වෙත ලැබෙන පරිදි, රජයේ දිසාපති නමට ලිපිනය ලියා, ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

(ඇ) එක දිනකට නියම කොට ඇති වෙන්දේසි පිළිබඳ සියළුම ටෙන්ඩර් බාර ගැනීම දිසාපති විසින් උචිත ටෙන්ඩර් දැන්වීමේ සඳහන් නිශ්චිත වේලාවක දී වසනු ලැබේ. මෙසේ එම ටෙන්ඩර් බාර ගැනීම වසා අවසන් වූ විගසම, දිසාපති විසින් හෝ මෙම කාර්යය සඳහා ඔහු විසින් නම් කරනු ලැබූ වෙනත් නිලධාරියෙකු විසින් හෝ නිශ්චිත වේලාවක දී එම ටෙන්ඩර් සියල්ල ම විවෘත කළ යුතුය.

**8. ටෙන්ඩර් පත්‍ර පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති බලය.—**

(1) ලැබී ඇති ඕනෑම ටෙන්ඩර පත්‍රයක් ස්වකීය අභිමතය පරිදි රජයේ දිසාපති විසින් පිළිගත හැකි ය.

(2) ලැබී ඇති ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ස්වකීය අභිමතය පරිදි රජයේ දිසාපති විසින් ප්‍රතික්ෂේප කළ හැකි වන අතර ටෙන්ඩර් පත්‍ර සියල්ලම එසේ ප්‍රතික්ෂේප කළ විටක ඔහු විසින් නියම කරන ලද යම්කිසි මුදලක් ගෙවීමට යම් ටෙන්ඩර් කරුවෙකු එකඟ කරවා ගත නොහැකි නම් ඔහු විසින් අලුතෙන් ටැන්ඩර් පත්‍ර කැඳවිය යුතුය.

(3) නැවත විකිණීමේ දී ලැබුණු යම් ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප වුවහොත් රජයේ දිසාපති විසින් අනුමත කරනු ලබන්නා වූ ද නියම කරන ලද යම්කිසි මුදලක් රේන්ද වශයෙන් ගෙවීමට එකඟ වන්නා වූ ද ඕනෑම පුද්ගලයකුට තැබෑරුම සඳහා තනි වරප්‍රසාදය රජයේ දිසාපති විසින් දිය හැකි ය.

(4) තැබෑරුම් කිහිපයක් ම එක මහනගර සභා හෝ නගර සභා හෝ සුළු නගර සභා පරිපාලන සීමාවන් තුළ පිහිටි විටෙක, එවැනි එක ම මහ නගර සභා හෝ නගර සභා හෝ සුළු නගර සභා සීමාවක් තුළ පිහිටි සියලු තැබෑරුම් සඳහා තමා විසින් සාධාරණ යයි සලකනු ලබන මුදලක් රේන්දය වශයෙන් ලැබෙන තුරු එවැනි එක් එක් තැබෑරුමක් වෙනුවෙන් යම් කිසි ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීම පිළිබඳ ස්වකීය තීරණය රජයේ දිසාපති විසින් කල් දැමිය හැකිය.

(5) එක ම මුදලට ටැන්ඩර් දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ලැබුන විට අනුගමණය කළ යුතු ක්‍රියා මාර්ගය :—එක ම මුදලට ටැන්ඩර් දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ලැබුණ විට, රජයේ දිසාපති විසින් සිය අභිමතය පරිදි—

(අ) කාසියක් උඩ විසි කිරීමෙන්, රේන්දය කාහට දිය යුතු ද යන්න තීරණය කිරීම, හෝ

(ආ) සියළුම ටැන්ඩර් ප්‍රතික්ෂේප කොට, අලුතින් ටැන්ඩර් සඳහා ඉල්ලුම් කිරීම හෝ කළ හැක.

9. (1) (අ) ඇප තැන්පත් මුදල්.—

(i) තනි බලය මිල දී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව තනි බලය ලත් තැනැත්තා එසේ ප්‍රකාශ කරනු ලැබූ දවසේ හෝ විකුණූ දිනයේ ප.ව. 4ට ප්‍රථම ඕනෑම වේලාවක, රජයේ දිසාපති විසින් නියම කරන මුදලක් ඇප ආධානය වශයෙන් ඔහු වෙත ගෙවිය යුතු ය. මේ ගෙවීම මුදලින් හෝ බැංකුවක් මගින් ''ගෙවීම සඳහාය''යි ලකුණු කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂක චෙක්'' යන ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක් පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට ම ලියන ලද චෙක් පතකින් කළ යුතු ය.

මිළ දී ගත් තැනැත්තාට, රජයේ දිසාපති විසින් එසේ කරන ලෙස ඉල්ලා සිටි විටක දී, මෙම කොන්දේසි අත්සන් කර, ඔහු විසින් තැන්පත් කර ඇති මුදල, යම් අවස්ථාවක දී මෙම තනි බලයට ගෙවිය යුතු මාස දෙකකට සමාන වන රේන්ද මුදලකට අඩු නම්, ඉතිරි මුදල ගෙවිය යුතු ය.

(ii) තනි බලය ලැබූ තැනැත්තා ගෙවූ ඇපය රු. 10,000 කට වැඩි වන්න වූ විටක දී ඔහුට අවශ්‍ය නම් තමා තනි බලය මිළ දී ගත් තැනැත්තා යයි ප්‍රකාශ කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත දී ඒ ඇපය සඳහා බැංකු ඇපයක් තැබිය හැකිය. ඒ ඇපය රජයේ දිසාපති බාරගත් විට, 9 (1) (අ) (1) වෙනි කොන්දේසිය යටතේ රේන්ද කාරයා විසින් තැබූ ඇප ආධානය ඔහුට ආපසු ගෙවනු ලැබේ.

(iii) වැළැක්විය නොහැකි කරුණක් නිසා හෝ වෙන යම් මොන කරුණක් නිසා හෝ තනි බලය ලත් තැනැත්තාට, එදින සවස 4ට පෙර එකී කොන්දේසි අත්සන් කොට ඇප ආධානය ගෙවීමට නොහැකි වුවහොත්, දිසාපතිගේ අභිමතය පරිදි, තමන් තනි බලය ලබාගත් තැනැත්තා යයි ප්‍රකාශ කරන ලද දිනට පසු දින දහවල් 12ට පෙර එම මුදල ගෙවන තුරු, කොන්දේසියේ අත්සන් කිරීමට අවසර දීමට පිළිවන.

(iv) තනි වරප්‍රසාදය අවසන්වූ විට සුරාබදු ආඥපනතේ 56 වැනි වගන්තිය යටතේ සිදු වූ යම්කිසි වරදක් සමථ කිරීම වශයෙන් ලබා ගත යුතු වූ හෝ රජයට ගෙවීමට ඇති අනෙක් යම් කිසි මුදලක් හෝ ගෙවීමට අසමත් වූ විටෙක අයකර ගැනීම සඳහා රජයේ දිසාපති විසින් සාධාරණ යයි සලකනු ලබන මුදලක් අතිරේක ඇප තැන්පත් මුදලක් ලෙස ගෙවන සේ රජයේ දිසාපති විසින් ප්‍රදන ලාභියාට නියම කළ හැකි ය. එසේ කිරීමට නියම කළ දින සිට දින හතක් ඇතුළත එම මුදල ප්‍රදනලාභියා විසින් රජයේ දිසාපතිට ගෙවිය යුතු ය.

(ආ) **බැඳුම්කරය අත්සන් කිරීම.**—තමා තනි බලය මිළදී ගත් තැනැත්තා යයි ප්‍රකාශ කරනු ලැබූ දින සිට දවස් දහහතරක් ඇතුළත දී, තනි බලය ලත් තැනැත්තා විසින්, තමා එය මිළදී ගනු ලැබූයේ යම් මුදලකට ද ඒ මුළු මුදල වෙනුවෙන්, 112 වෙනි ආකෘති පත්‍රයේ දිසාපති සමග බැඳුම්කරයකට බැඳී ඇප ආධානය ඒ බැඳුම්කරයෙන් ම විශේෂයෙන් යටත් කොට බැඳ තැබිය යුතුය. බැඳුම්කරය වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු නම්, ඒ ගාස්තුව මේ තනි බලය ලත් තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(ඇ) **බැඳුම්කරයේ කොන්දේසි කඩකිරීමේ ප්‍රතිවිපාක.**—මේ කොන්දේසි වලින් යමක් හෝ මෙහි පහත 14 (2) වෙනි කොන්දේසියේ සඳහන් බලපත්‍ර වල කොන්දේසිවලින් යමක් කඩ කිරීම නිසා හෝ යම් කිසි කොටස් මුදලක් නො ගෙවීම නිසා හෝ නීති මාර්ගයෙන් ක්‍රියා නොකර, තමා ගේ තනි අභිමතය පරිදි, ඒ ඇප ආධානය හෝ ඉන් කොටසක් හෝ රාජසන්තක කිරීමට රජයේ දිසාපති ට පිළිවන. ඒ රාජසන්තක කිරීම වූ කලි, කඩකිරීමේ හෝ නොගෙවීමේ හෝ හේතුවෙන් මෙම කොන්දේසිවලින් නියම කරන ලද අන්කිසි දඩුවමකටත්, රජය විසින් විඳිවූ ප්‍රකාර නීති මගින් අයිතිවාසි කම් දක්වා, අය කර ගත හැකි වෙන යම් මුදලකටත් අතිරේක වශයෙන් විය හැක.

(2) **ඇප ආධානය බැංකුවේ තැන්පත් කිරීම.**—එසේ ගෙවන ඇප මුදල රජයෙන් අනුමත කරනු ලැබූ බැංකුවක, තනි බලකරු ගේ ඉල්ලීම හා ඔහුගේ ම වගකීම පිට තැන්පත් කරනු ලැබේ. එසේ තැන්පත් කළ මුදලින් කිසිත්, මේ කොන්දේසි සතුටුදායක පරිද්දෙන් ඉටු කර නිමවන තුරු ආපසු ගැනීමට ඉඩ දෙනු නො ලැබේ,

(3) **නඩු තීන්දු භාර ගන්නා බවට අණක් හෝ ඇටෝර්නි බලය හෝ දීම.**—පිළිගත් ටෙන්ඩරයේ දක්වෙන මුදල රු. 2,000 කට වැඩි වෙතොත්, තනි බලය ලැබූ තැනැත්තා විසින් පූර්වෝක්ත ප්‍රකාර ඔප්පු අත්සන් කරන විට, රජයේ දිසාපති විසින් නියම කරනු ලැබුව හොත් මේ තනි බලය සඳහා අය කර ගත යුතු යම් මුදලක් ලබා ගැනීමට, ඔහුට විරුද්ධව පවරන යම් නඩුවක දී, එකී නඩු තීන්දුව භාර ගැනීමට එකඟ වන බවට, ආඥාපත්‍රයක් හෝ ඇටෝර්නි බල පත්‍රයක් හෝ, අනුමත නීතියේ ප්‍රකාර, අනුමත කරන ලද ආකෘති පත්‍රයෙහි ලියවා, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 32 වැනි වගන්තිය යටතේ දිස්ත්‍රික් උසාවියේ අමුනා තැබීම සඳහා එකී ආඥාපත්‍රය හෝ ඇටෝර්නි බලය ලියූ දින සිට පහළොස් දිනක් ඇතුළත දී විධි වූ ප්‍රකාර සහතික කළ පිටපතක් රජයේ දිසාපති වෙත යැවිය යුතුයි.

(4) **තැපැල් ලිපිනය.**—තනි බලය පවරනු ලැබූ තැනැත්තා විසින්, මේ කොන්දේසි අත්සන් කරන විට තනි බලය පිළිබඳ සියලු ම දැන්වීම් හා කැඳවීම් නියෝග තමාට එවිය යුත්තේ, අසවල් තැපැල් කාර්යාලයට හෝ අසවල් තැපැල් ලිපිනයට යන්න තීරණය කර, එය ලියවිල්ලකින් අත්සන් කොට දිය යුතුය. ඒ තැපැල් කාර්යාලයට හෝ තැපැල් ලිපිනයට හෝ ලැබෙන පරිදි යථා කාලයේ දී තැපැල් කරන ලද එකී සියලු ම දැන්වීම් හෝ කැඳවීම් නියෝග විධි වූ ප්‍රකාර බාරදෙනු ලැබූ සේ සැළකිය යුතුවා පමණක් නොව, දැන්වීම් හෝ කැඳවීම් නියෝග එසේ තැපැල් කරන්නට යෙදුන දිනයේ දී එය තනි බලකාරයාට පෞද්ගලිකව ම බාර දෙනු ලැබූ ලෙසට සියලු කටයුතු සඳහා පිළිගත යුතුවා ඇත.

10. **තනි මිළයට ගැනීම සම්පූර්ණ කිරීමට නොහැකිවීම.**—යම් ටෙන්ඩර් කරුවකු තමා තනි බලය මිළයට ගත් ගැනුම්කරු යයි ප්‍රකාශ කරනු ලැබී මෙන් පසු 9 (1) වෙනි කොන්දේසියෙහි සඳහන් කාලය තුළ දී, විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම ප්‍රතික්ෂෙප කළ හොත්, නො එසේ නම් ඔහුට ඒවා අත්සන් කිරීම නො හැකි වුවහොත්, එසේත් නැත්නම් කොන්දේසි යෙන් නියමිත ඇපය, එකී කාල සීමාව තුළ දී තැබීමට ඔහුට නොහැකි වූවහොත්, ඔහුට දෙන ලද එම තනි බලය අවලංගු කරනු ලැබූ ලෙසට කරුණු ප්‍රකාශ කොට 4 වෙනි කොන්දේසිය යටතේ ඔහු තැබූ ආධාන මුදල් රාජසන්තක වූ බව ද ප්‍රකාශයෙහි දක්වා, ඔහුගේ නම, සියලූ ම සුරාබදු බලපත්‍ර සම්බන්ධයෙන් යුතුකම් පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට සිදු විය හැකි ය. මේ ව්‍යතිරේකයට යටත්ව, සුදුසුකම් ලත් ටෙන්ඩර්කරු විසින් විකුණුම් කොන්දේසි අත්සන් කොට පූර්වෝක්ත ඇපය තැබූ පසු, අනෙකුත් සෑම ටෙන්ඩර්කරුවන් විසින් ම තබන ලද ඇප ආධාන ඔවුනට ආපසු ගෙවනු ලැබේ.

11. **තව තනි වරප්‍රසාදය මිළට ගැනීමෙන් පසුව, එහෙත් එම වරප්‍රසාදය ආරම්භ වීමට පළමුව එවකට බල පවත්නා තනි වරප්‍රසාදය අවලංගු කිරීමේ ප්‍රතිවිපාක.**—තනි වරප්‍රසාදය මිළට ගත් තැනැත්තා මේ රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීමෙන් පසුව එහෙත් ඇත්ත වශයෙන් ම එම වරප්‍රසාදය ආරම්භ වීමට පෙර තමා විසින් කලින් ලබා ගෙන තිබූ අරක්කු, රා හෝ විදේශීය මත්පැන් විකිණීමේ යම් කිසි තනි වරප්‍රසාදයක් අවලංගු කරනු ලැබුවහොත්, රජයේ දිසාපති විසින් ස්වකීය පරම අභිමතය පරිදි 8 (1) වැනි කොන්දේසිය යටතේ තනි වරප්‍රසාදය පිළිගැනීම අවලංගු කොට ප්‍රදන ලාභියාට තම අවලංගු කිරීමේ නියෝගය ගැන දැනුම් දිය හැකි ය එ වැනි අවලංගු කිරීමේ නියෝගයක් කළ විට මුලින් කළ පිළිගැනීම අවලංගු ද බල රහිත ද වන්නේ ය. එ වැනි අවලංගු කිරීමක ප්‍රතිඵලයක් වශයෙන් රජයෙන් කිසිදු වන්දියක් ඉල්ලා සිටීමට තනි වරප්‍රසාදය මිළට ගත් අයට හිමිකමක් නැත. 10 වැනි කොන්දේසියේ සඳහන් කිසිවක් ගැන නො සළකා 4 වැනි කොන්දේසිය යටතේ තුබූ තැන්පත් මුදලක් හෝ 9 (1) (අ) වැනි කොන්දේසිය යටතේ තැබූ ඇප තැන්පත් මුදලක් හෝ එකී තැන්පත් මුදල් දෙවර්ගය ම හෝ රාජසන්තක වීමට යටත් විය යුතු ය.

12. **රා සහ රටබීම විකිණීම, වතු සුරාසැල්, බෝතල පිරවීමේ කොන්ත්‍රාත්තු සහ අරක්කු පදම් කිරීම ආදිය පිළිබඳව කිසිම සම්බන්ධතාවයක්, තනි බලයක් ලත් තැනැත්තාට නොතිබිය යුතු බව.**—තනි බලය ලැබූ තැනැත්තා විසින්, නියම වශයෙන් හෝ අනියම් වශයෙන් පහත දක්වෙන දැයින් කොටසක් හෝ එයට සම්බන්ධකමක් හෝ ඒ පිළිබඳ අත්පත් කර ගැනීමක්, කිසිම සම්බන්ධකමක් නොදැරිය යුතුය.

(අ) අරක්කු විකිණීමේ තනි බලයට සම්බන්ධ ප්‍රාදේශිය කොට්ඨාශ ඇතුළත—

(1) රා විකිණීම සම්බන්ධව;

(2) රා විකිණීම පිළිබඳව ඕනෑම බලයක් මිළයට ගැනීම සම්බන්ධව;

(3) රටබීම විකිණීම සම්බන්ධව;

(4) රටබීම විකිණීම පිළිබඳ ඕනෑම බලයක් මිළයට ගැනීම සම්බන්ධව; හෝ

(ආ) අරක්කු විකිණීමේ බලය සම්බන්ධ ආදායම් දිස්ත්‍රික්කයේ ඕනෑම වතු සුරාසැලක් සම්බන්ධව; හෝ

(ඇ) අරක්කු බෝතල පිරවීම පිළිබඳව රජය සමග වූ ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන්; හෝ

(ඈ) අරක්කු පදම් කිරීමට හා තොග වශයෙන් විකිණීම පිණිස නිකුත් කළ බලපත්‍රයක් හෝ සම්බන්ධය,

**13. බෝතල සඳහා වූ අතිරේක ඇප ආධානය; හිස් බෝතල ආපසු බාරදීම නිමිත්තෙන් නිකුත් කිරීම.**—(1) තනි බලය ලබාගත් තැනැත්තා විසින්, තමා වෙත රජයේ ඕනෑම ගුදමකින් නිකුත් කරන අරක්කු අඩංගු බෝතල වෙනුවට බෝතල් දීම අවශ්‍ය නොවිය හැක. නමුත් මේ තනි බලය පවතින කාල පරිච්ඡේදයේ දී, ඕනෑම වේලාවක, ඕනෑම තනිබලයක් ලත් තැනැත්තෙකුට ඕනෑම රජයේ ගුදමකින් නිකුත් කළ අරක්කු අන්තර්ගත බෝතල, රජයේ දේපල බවට සුරාබදු කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කළ විට, තනි බලය ලත් තැනැත්තා විසින් තමන්ට නිකුත් කළ බෝතල් අරක්කු ගැලුම් ගණනට සමාන හිස් බෝතල ඊළඟ අරක්කු නිකුත් කිරීමේ වාරයේ දී රජයට භාර දිය යුතුය. නිකුත් කරන ලද සුදු බෝතල වෙනුවෙන් එම හැඩයේ සහ එම ප්‍රමාණයේ ම, සුදු බෝතල පමණක් බාරදිය යුතුය. සුදු බෝතල හැරුණු විට අනෙක් බෝතල සම්බන්ධයෙන්, තනි බලය ලත් තැනැත්තාට නිකුත් කළ බෝතලවල හැඩයේ ම සහ එම ප්‍රමාණයේ, ඕනෑම වර්ගයක බෝතල ඒ වෙනුවට භාරදිය හැක. ඩ්‍රැම් $3\frac{3}{7}$කට වඩා අඩු ප්‍රමාණයක් අඩංගු වන බෝතල් ඒ වෙනුවට බාරගනු නොලැබේ.

ඕනෑම බෝතල් අරක්කු ගැලුම් ගණනක් වෙනුවෙන් වූ, හිස් බෝතල ප්‍රමාණය ගණන් ගැනීමේ අභිප්‍රායෙන්—

(අ) බෙල්ලේ මට්ටමට ඩ්‍රැම් 8කට වඩා අඩංගු වන බෝතලයක් ඩ්‍රැම් 8 වේ (එනම් ගැලුමකට බෝතල 6 ක් බැගින්) බෝතලයක් වශයෙන් ද,

(ආ) බෙල්ලේ මට්ටම ඩ්‍රැම් $3\frac{3}{7}$ කට නොවැඩි, ඩ්‍රැම් 6කට අඩුවෙන් අඩංගු වන බෝතලයක් ඩ්‍රැම් හතරේ (එනම් ගැලුමකට බෝතල 12 බැගින්) බෝතලයක් වශයෙන් ද සලකනු ලැබේ.

කෙසේ වෙතත්, නිකුත් කරන ගුදම භාර ගුදම් නිලධාරියාගේ අභිමතය පරිදි, පහත සඳහන් වර්ගවල ඕනෑම බෝතලයක් ප්‍රතික්ෂෙප කළ හැක :—

(අ) ''ලංකා සුරාබදු'' යන්න මුද්‍රණය කොට නොමැත්තා වූ හා ගුදම් වලින් නිකුත් කරන බෝතල්වල මෙන්, බෝතල් කෙරෙහි ඇබ සඳහා, කරකවන මූඩි ක්‍රමයට නොමැත්තා වූ; හෝ

(ආ) බිඳීගිය හෝ කැඩීගිය; හෝ

(ඇ) ඕනෑම කරුණක් නිසා, අරක්කු පිරවීමට නුසුදුසු උදහරණයක් වශයෙන් කියතොත්, එකී නිලධාරියාගේ අදහසේ හැටියට තාර, වාර්නිෂ් තෙල් හෝ වෙනත් ද්‍රව්‍යයක් තබා ගැනීමට බෝතලය පාවිච්චි කිරීම නිසා, අදළ ගුදමෙහි බෝතල් පිරිසිදු කිරීමට යොද තිබෙන සාමාන්‍ය විධියෙන්, එම බෝතලය අවශ්‍ය පරිදි පිරිසිදු කර ගැනීමට අපහසු වීම.

නමුත්, තනි බලය ලත් තැනැත්තා විසින් ගුදමභාර අධිකාරී වෙත ආයාචනා කිරීමේ අයිතියක් ඔහුට ඇත. එම ආයාචනය සම්බන්ධයෙන් එම නිලධාරියාගේ නියෝගය අවසාන වූත් මෙන්ම තීරණාත්මක වූත් අතර, තනි බලය ලත් තැනැත්තා එයට බැඳී සිටී.

**(2)** තනි බලය පිළිබඳ කාලපරිච්ඡේදය තුළ දී නිකුත් කරණ ලද සම්පූර්ණ බෝතල් අරක්කු ගැලුම් ගණනට සමාන, සුදු හා අනෙකුත් බෝතල, තනි බලය අවසානයේ දී බාර නොදී හැරීම වැළැක්වීම පිණිස, තනි බලය ලත් තැනැත්තා විසින්, තමන්ට එසේ කරන ලෙසට දන්වා දින හතක් ඇතුළත මෙහි ''අ'' උපලේඛනයෙහි 3 වෙනි තීරුවේ දක්වා ඇති මුදල, එකී උප ලේඛනයෙහිම 2 වෙනි තීරුවෙහි දක්වා ඇති තැබෑරුම් අනුව, තමාට දනය කළ තනි බලයට අදල තැබෑරුම වෙනුවෙන්, අතිරේක ඇප ආධානයක් වශයෙන් රජයේ දිසාපතිට ගෙවිය යුතු ය. එකී අතිරේක ඇප ආධානය වනාහි හැඩය, ප්‍රමාණය හෝ වර්ණය ගැන නොසලකා සෑම වේලාවකදීම මේ තනි බලය ලත් තැනැත්තා ළඟ තිබෙන බෝතල්වලට, බෝතල්, ගැලුම රු. 7.50 ගණනේ නියම කරණ ලද වටිනා කම පෙන්නුම් කිරීම සඳහාය. තනි බලය පිළිබඳ කාලපරිච්ඡේදය අවසාන වීමේදී, බෝතල් ආපසු භාර නොදීම සම්බන්ධයෙන් යම් අඩුවක් ඇතිවූ විට, සුරාබදු කොමසාරිස් විසින් ඉහත සඳහන් මිල ප්‍රමාණය අනුව, එම අඩු බෝතල්වල වටිනාකම, තැබූ අතිරේක ඇප ආධානයෙන් කපාගනු ලැබේ. තවද බෝතල නැතිවීමෙන් රජයට සිදු වූ පාඩු මෙපමණ යයි කලින් ඇස්තමේන්තු කර, නීති මාර්ගයෙන් කිසිත් නොකරම, එකී බාර නොදී තිබෙන සුදු හා අනෙක් බෝතල් ප්‍රමාණයේ නියම ගණන මෙපමණයයි සඳහන් කර, නිකුත් කරන ගුදම බාර සුරාබදු අධිකාරී විසින් දෙන සහතිකයක් පිට එකී අතිරේක ඇප ආධානයෙන් අයකර ගැනීමට පිළිවන. එම සහතිකය අවසන් වූවාක් මෙන් ම තීරණාත්මක වන අතර, තනි බලය ලත් තැනැත්තා එයින් බැඳී සිටී. තනි බලය ලත් තැනැත්තා විසින් ඇප අතිරේක ආධානය සැපයීමට අසමත් වුවහොත්, එවැනි තනි බලය ලත් තැනැත්තකුට සීල් බෝතල්වලින් අරක්කු නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට, ගුදම් භාර නිලධාරියාට පිළිවන.

(3) නිකුත් කිරීමට ඇති ප්‍රථම අරක්කු තොගයේ වටිනාකමට, නිකුත් කරන, කච්චේරි කුවිතාන්සිය මෙන්, එකී අතිරේක ඇප ආධානයටද, වෙනම කච්චේරි කුවිතාන්සියක් නිකුත් කරන ගුදමේ දී එම වේලාවේ දී ම ඉදිරිපත් කළ යුතුය. මෙම කුවිතාන්සි දෙකම ගුදම් නිලධාරියාගේ භාරයේ තබාගනු ඇත. එසේ කුවිතාන්සි දෙකම ඉදිරිපත් නොකළහොත්, ප්‍රථම අරක්කු තොගය නිකුත් කරනු නොලැබේ.

(4) අරක්කු නිකුත් කරන ගුදමේ තබාගනු ලබන ලේඛනයක, කච්චේරි කුවිතාන්සියේ අංකය, දිනය, මුදල සහ කච්චේරියේ නම ද සටහන් කර තබන අතර, එම සටහන්වල නිවැරදි බව පිළිගනු වස්, තනි බලය ලැබූ තැනැත්තා විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් හෝ, එහි අත්සන් කරනු ලැබේ. එකී අතිරේක ඇප ආධානය යටතේ කලින් කලට නිකුත් කරන ලද (අ) සුදු බෝතල් සහ (ආ) අනෙක් බෝතල් අරක්කු ගැලුම් ගණන ද පසුව නිකුත්කිරීම් දිනවල දී ආපසු දෙන ලද (1 වෙනි ඡේදයේ පරිදි ගණන් බලා) ඒ ඒ වර්ගවල හිස් බෝතල ගැලුම් ගණන හා පසුව නිකුත් කිරීම් වලදී තනි බලය ලත් තැනැත්තා අතේ ඉතිරි වූ ඒ ඒ වර්ගවල බෝතල (ඉහත 1 වැනි ඡේදයේ මෙන් ගණන් බලා) ඉතිරි ගැලුම් ගණනත්, එකී ලේඛනයේ සටහන් කර, තනි බලය ලත් තැනැත්තා විසින් හෝ ඔහුගේ නියෝජිතයා විසින් හෝ පෙරකී අදහසටම එය ද අත්සන් කරනු ලැබේ.

(5) දැනට පවතින තත්ත්වය හේතුකොට, බෝතල් සැපයීම හිඟවීම නිසා, තනි අයිතිය ලැබූ අයෙකුගේ ඉල්ලීමේ ප්‍රමාණයටම අරක්කු සීල් බෝතල්වලින් සැපයීමට නොහැකි වුවහොත්, අරක්කු නිකුත් කරන ගුදමෙන් කලින් කල ලබාගත හැකි සීල් බෝතල් අරක්කු ප්‍රමාණය 1954–55 රේන්ද වර්ෂයේ ගුදමෙන් කලින් කල නියම කරනු ලබන වෙනස් වෙනස් වූ සීයයට ගණන්වලට සීමා කරනු ඇත. එක් තැබෑරුමක් තවත් තැබෑරුමක් අතර ඇති අරක්කුවල සියයට ප්‍රමාණය, විශේෂ අවස්ථාවල දී ගුදම භාර සුරාබදු අධිකාරීන්ට සුදුසු යයි හැඟෙන පරිදි හැර, ආසන්න වශයෙන් සාමාන්‍ය වර්ගවල හා අති විශේෂ වර්ගවල අරක්කු, එකී 1954–55 වර්ෂය තුළ එක් එක් තැබෑරුමට නිකුත් කරන ලද සීල් බෝතල් අරක්කුවල අනුපාතික ප්‍රමාණය පදනම් කොට ගණන් ගනු ලැබේ.

(6) දෙවැනි වරට සහ ඊට පසුව කෙරෙන සීල් බෝතල් අරක්කු නිකුත් කිරීම සම්බන්ධයෙන්, තනි බලය ලත් තැනැත්තා විසින්, සියතෙහි ඉතිරිව තිබෙන සුදු සහ අනෙකුත් බෝතල් (ඉහත (1) වෙනි ඡේදයේ පරිදි ගණන් බලා) ගැලුම් ගණන, කොටසකින් හෝ මුළු තොගයෙන් හෝ ආපසු ගෙනවිත් බාරදෙන කොන්දේසිය පිට සිදු කෙරේ.

(7) කෙසේ වෙතත්, ඔහුට ලැබිය යුතු බෝතල් අරක්කු ප්‍රමාණය, ඔහු විසින් ආපසු බාර දී ඇති බෝතල් ගැලුම් ගණනට (ඉහත (1) වැනි ඡේදයේ පරිදි ගණන් බලා) වැඩි නම් ගුදම් නිලධාරියා විසින් සිය අභිමතය පරිදි එකී ගැලුම් ගණනට සමාන වන පරිදි ඔහුගේ සලාකයෙන් ඔහුට ලැබිය යුත්තේ මෙපමණ යයි නිකුත් කරනු ලැබේ. තවද ගුදම් නිලධාරියා විසින් සිය අභිමතය පරිදි එම සලාකයෙන් ඉතිරි නිකුත් නොකරන ලද කොටස, බෝතල් ආපසු ගෙනැවිත් දුන් විට, පසුව නිකුත් කිරීමක් සඳහා වෙන්කර තැබීමට හෝ සම්පූර්ණ සලාකයම නිකුත් කිරීමට හෝ ඔහු විසින් තීරණය කළ හැක.

(8) ආපසු බාර දෙන ලද බෝතල (ඉහත (1) වැනි ඡේදයේ පරිදි ගණන් බලා) ගැලුම් ගණන, දිය යුතු සලාකයට වඩා අඩුවූ විටක දී දිය යුතු පූර්ණ සලාකය කුමක් වුවත්, ගුදම් නිලධාරියා විසින් සිය අභිමතය අභ්‍යාස කිරීම හේතුවෙන් තනි බලය ලත් තැනැත්තාගේ අතේ ඉතිරිව ඇති බෝතල් ගැලුම් ගණනේ වටිනාකම, ඉහත (2) වැනි ඡේදයෙන් දැක්වෙන පරිදි ඔහු විසින් දැනටමත් තැන්පත් කොට ඇති අතිරේක බෝතල් ඇප ආධානයේ මුදලවත් නොසෑහෙන තරමේ ප්‍රමාණයකට, එය වැඩි වන බැව් පෙනුන හොත්, එකී තනි බලය ලත් තැනැත්තා විසින් තබා ඇති අතිරේක බෝතල් ඇප ආධානය තවත් මුදලකින් වැඩි කරනු වස් තවත් වැඩිපුර මුදලක් ගෙවන ලෙසට ගුදම් නිලධාරියා විසින් ඔහුගෙන් ඉල්ලීමක් (අතිරේක ඇප ආධානය මෙන් එම මුදලත්, එම කොන්දේසි අනුව තබනු ඇත) හෝ නොඑසේ නම් සම්පූර්ණ සලාකය නිකුත් කිරීමට මත්තෙන්, අවශ්‍ය ප්‍රමාණය දක්වා වූ හිස් බෝතල් ගැලුම් ගණන සපයන ලෙසට හෝ ඉල්ලුම් කිරීමට පුළුවන.

තවදුරටත් අවශ්‍ය මුදල නොගෙවුවහොත්, ගුදම් නිලධාරියා විසින් ඉල්ලීමක් කොට 24 පැයක් ඇතුළත දී හිස් බෝතල ආපසු බාර නුදුනහොත්, සීල් බෝතල්වලින් හෝ තොග අරක්කුවලින් හෝ කරනු ලබන අරක්කු නිකුත් කිරීම් සිදු නොකොට ප්‍රතික්ෂෙප කිරීමට ගුදම් නිලධාරියාට පිළිවන.

(9) මෙයට විරුද්ධ වූ යම් ඕනෑම දෙයකට අනුකූල නොවී සුරාබදු කොමසාරිස් විසින් තනි අයිතිය ලත් තැනැත්තා අරක්කු නිකුත් කරන බෝතල් රජයේ දේපල බවට ප්‍රකාශ කළායින් පසු තනි අයිතිය ලත් තැනැත්තාට රජයේ ඕනෑම ගුදමකින් නිකුත් කරන සීල් අරක්කු බෝතල ගැලුම් ගණනට සමාන සුදු හා අනෙක් බෝතල ගැලුම් ගණනක්, තනි අයිතිය ලබාගත් තැනැත්තා ම විසින් ආපසු බාරදිය යුතුය. සුරාබදු කොමසාරිස් විසින් මෙම නියෝගය සඪුව අවලංගු කළහොත් එදිනට පළමු දින වනතුරු එය වලංගු වන්නේය.

එවැනි ප්‍රකාශය අවලංගු කිරීමෙන් දින 14 ක් ඇතුළත දී එකී හිස්බෝතල ගැලුම් ගණන ආපසු බාර නුදුනහොත් තනි අයිතිය ලත් තැනැත්තාට බෝතල අරක්කු හෝ තොග අරක්කු හෝ දෙවර්ගය ම හෝ නිකුත් කිරීම ප්‍රතික්ෂෙප කිරීමට ගුදම් නිලධාරියාට අවසර ඇත.

(10) මෙම කොන්දේසියේ (7), 8 වැනි සහ 9 වැනි ඡේදයන් යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව ගුදම් නිලධාරියා විසින් සිය අභිමතය අභ්‍යාස කිරීමක දී එයට විරුද්ධ ව ගුදම් භාර සුරාබදු අධිකාරී වෙත ආයාචන යක් කිරීමට, තනි බලය ලත් තැනැත්තාට හැකිවූ මුත්, එම කරුණ ගැන එම අධිකාරීගේ තීරණය, අවසාන හා තීරණාත්මක වන අතර, තනි බලය ලත් තැනැත්තා එයින් බැඳී සිටී.

(11) ඉහත (4) වැනි ඡේදයේ සඳහන් ලේඛනයෙහි දැක්වෙන පරිදි තනි බලය ලත් තැනැත්තා අතේ ඉතිරිව ඇති ඒ ඒ වර්ගවල හිස් බෝතල් ගැලුම් ගණනේ වටිනාකම ඉහත (2) වැනි ඡේදයේ යොද ඇති මිළ ගණන් පරිදි අඩු කරගෙන, එකී අතිරේක ඇප ආධාන හා තවත් මුදලක් ඇත්නම්, එයත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ මෙම තනි බලයේ කාල පරිච්ඡේදයේ අවසානයේ දී ඔහුට ආපසු ගෙවීමට පුළුවන.

(12) අතිරේක ඇප ආධානය හා තවත් යම් කිසි මුදලක් ආධාන වශයෙන් තනි බලය ලත් තැනැත්තා විසින් ගෙවා තිබේ නම්, එයත්, මෙහි 9 (2) වැනි කොන්දේසියේ මෙන් මුදහරිනු ලැබේ. තවද බෝතල් සම්බන්ධයෙන්

21. (1) **ගුදමේ අරක්කු මිළදී ගැනීම.**—තනි බලය ලබා ගත් තැනැත්තා විසින් එවැනි රජයේ ගුදමකින් හෝ රජයේ ගුදම් වලින් අරක්කු මිලදී ගත යුත්තේ සුරාබදු කොමසාරිස් විසින් නියෝග කරනු ලබන එවැනි දිනවල දී පමණකි. එතෙකුදු වුවත්, අරක්කු පදම් කිරීමට හා ඒවා තොග වශයෙන් විකිණීමට බලපත්‍රයක් හිමි බලපත්‍රධාරියෙකු ගෙන් තමාට අවශ්‍ය පදම් කළ අරක්කු ලබා ගත හැක.

(2) **පෝය දිනවල සහ නිවාඩු දිනවල අරක්කු නිකුත් කිරීම නොමැති බව.**—සුරාබදු අධිකාරිගෙන් කලින් ලැබුන අනුමතියක් නොමැතිව, පෝය දිනවලදී හා රජයේ නිවාඩු දිනවලදී, ගුදමකින් අරක්කු නිකුත් කරනු නො ලැබේ.

(3) **ගුදම් වලින් අරක්කු නිකුත් කිරීම.**—පෝය දිනට පෙර දින හැර අන් සෑම දිනවලදී පෙ.ව. 8.30 ත් ප.ව. 2.30 ත් අතර කාලය තුලදී හෝ පෝය දිනට පෙර දිනවලදී පෙ.ව. 8.30 ත් දවල් 12 ත් අතර කාලය තුලදී පමණක් ගුදම්වලින් අරක්කු නිකුත් කරනු ලැබේ.

(4) **ප්‍රවාහණ අවසර පත්‍ර.**—ගුදමක සිට මාර්ගයක් ඔස්සේ වාහනයකින් තැබෑරුමකට අරක්කු ප්‍රවාහන කරන අවස්ථාවකදී, ගුදම් නිලධාරියා විසින් යම් විශේෂ කරුණකදී හැර නිකුත් කරන දින දී ප.ව. 6.30 ට පසුව පාවිච්චි කළ හැකි වන සේ වලංගු වන ප්‍රවාහන අවසර පත්‍ර නිකුත් කරනු නොලැබේ. එවැනි ප්‍රවාහණ අවසර පත්‍රයකින් නිකුත් කරන ලද සම්පූර්ණ අරක්කු ප්‍රමාණය එකට වාහනයකින් එක් වාරයක දී ම රැගෙන යා යුතුය.

(5) **නිකුත් කළ අරක්කු භාරගත් බව.**—තනි බලය ලත් තැනැත්තා විසින්, තමාට නිකුත් කරන ලද අරක්කු භාරගත් බවට සාධකයක් වශයෙන් තෙපිටපතින් යුත් අරක්කු ප්‍රවාහන අවසර පත්‍රයට සිය අත්සන, ගුදමේ දී තබා, අරක්කු ප්‍රවාහණය කරන වාහනය ගුදමෙන් පිටත් වන නිවැරදි දිනය සහ වේලාව ද එහි සටහන් කළ යුතුය.

22. **තනි බලය ලැබූ තැනැත්තාට අරක්කු යම් කිසිවක් දෙන ලද සේ භාර ගැනීම.**—(1) අරක්කු බෙදා හැරීම පාලනය කරනු වස්, නිකුත් කිරීමට ඇති අරක්කු ප්‍රමාණ සෑහේ යයි හැඟෙන යම් කාලයක් ගත වන තුරු සුරාබදු කොමසාරිස් විසින් සිය අභිමතය පරිදි—

(අ) තනි බලය ලැබූ තැනැත්තාට ඕනෑම අරක්කු ප්‍රමාණයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැක.

(ආ) තොග වශයෙන් හා සීල් බෝතල් වලින්, සෑම මාසයකට, තනි බලධාරියාට නිකුත් කළ යුතු වර්ගය හා ප්‍රමාණය කොතෙක් දැයි අධිෂ්ඨානය කර ගත හැක.

(2) ගුදම් නිලධාරියා විසින්, එසේ කරන ලෙසට නියෝග කොට 24 පැයක් ඇතුළත දී, සුරාබදු කොමසාරිස් විසින් අධිෂ්ඨානය කර ගනු ලබන පරිදි, තනි බලධාරියා වෙත නිකුත් කිරීමට ඇති එවැනි අරක්කු, තොග වශයෙන් හෝ සීල් බෝතල් වලින් හෝ එවැනි සැර ගතියෙන් වර්ගයෙන් සහ ප්‍රමාණයෙන් හා හැඩයෙන් යුත් බෝතල්වලින් හෝ බාරගෙන මුදල් ගෙවීමට, එම තනි බලය ලත් තැනැත්තා බැඳී සිටී.

(3) තනි බලය ලත් තැනැත්තා විසින්, සීල් බෝතල් අරක්කු හා/හෝ තොග අරක්කු සිය තැබෑරුමේ ගබඩා කර තබාගෙන සුරාබදු කොමසාරිස් විසින්, ඉහත (1) වෙනි ඡේදයෙන් අධිෂ්ඨාන කරනු ලැබූ ප්‍රමාණය අවසාන වන තුරු, යම් මාසයක් තුල දී, එම සීල් බෝතල් අරක්කු හා/හෝ තොග අරක්කු, අඛණ්ඩව වෙළඳාම් කිරීමට අපොහොසත් වූ විටක දී, වෙම තනි බලය ලත් තැනැත්තා විසින් යම් විශේෂ මාසයක දී එසේ අඛණ්ඩව වෙළඳාම කරගෙන යාමට අපොහොසත් වූ වේලාවේ සිට, ලබා නොගෙන, ඉතිරිව ඇති සීල් බෝතල් අරක්කු හා/හෝ තොග අරක්කු සියල්ල ම රාජසන්තක කරනු ලැබේ.

23. **බෝතල්වල මූඩි බුරුල්වීම හා මුද්‍රා කැඩී යාම.**—තනි බලය ලත් තැනැත්තාට නිකුත් කරන සෑම අරක්කු බෝතලයකම මූඩි හොඳින් සවි කර තිබේ ද, එවැනි බෝතල්වල යොද ඇති මූඩියෙහි ඇති මුද්‍රා නිසි පරිදි සම් බන්ධ කොට තිබේ ද යන්න හා එහි සුරාබදු දෙපාර්තමේන්තුවේ මුද්‍රාව පැහැ දිලිව යොද ඇද්ද යන්න තමාට සහතික වනු පිණිස වග බලා ගත යුතුය. යම් මූඩියක් ස්ථිරව සවි කර නොමැතිව හෝ මුද්‍රාව ගැලවී හෝ එම මුද්‍රාව නොපැහැදිලිව හෝ ඇත්නම් එවැනි බෝතල් බාර ගැනීම ප්‍රතික්ෂෙප කිරීමට ඔහුට පුළුවන.

24. **තොග අරක්කු සඳහා භාජනත්, ලබාගත් අරක්කු ප්‍රමාණයන් නිවැරදි බවත් සොයා බැලීම.**—තොග අරක්කු ලබා ගැනීම සඳහා තමා විසින් සපයනු ලබන භාජන මුළුමනින්ම හිස් ඒවා බවට, තනි බලය ලත් තැනැත්තා නිසැකවම වග බලා ගත යුතු අතර තමා විසින් ගෙවන ලද මුදලට හා කච්චේරි කුවිතාන්සියේ සහ නිවේදන පත්‍රවල පෙන්නුම් කෙරෙන ප්‍රමාණයට වඩා, වැඩිපුර කිසිම අරක්කු ප්‍රමාණයක් ඔහු විසින් කිසිම අවස්ථාවක දී ප්‍රවාහණය නොකළ යුතුය. එලෙසම ඔහු විසින් ගෙවන ලද මුදලට හා කච්චේරි කුවිතාන්සියේ සහ නිවේදන පත්‍රවල පෙන්නුම් කෙරෙන ප්‍රමාණයන්ට වඩා වැඩිපුර, බෝතල්ගත අරක්කු කිසිම ප්‍රමාණයක් ප්‍රවාහණය නොකළ යුතුය.

25. **තොග අරක්කුවලට නිකුත් කරන සීල් බෝතල් අරක්කු අනුපාතය.**—තනි බලය ලත් තැනැත්තා විසින් අරක්කු ලබා ගන්නා විට, ගුදම් භාර නිලධාරියා විසින් අවශ්‍ය වන පරිදි, සෑම වර්ගයකම සීල් බෝතල් අරක්කු අනුපාතයක් එකී අරක්කු වෙනුවෙන් ගත යුතුය.

26. **පදම් කළ අරක්කු විකිණීම.**—(1) ප්‍රදේශය භාර සුරාබදු අධිකාරි විසින්, ඒ වෙනුවෙන් නිකුත් කරන ලද වලංගු ප්‍රවාහන අවසර පත්‍රයක් යටතේ හැර, යම් තැබෑරුමක තනි බලය ලත් තැනැත්තා විසින්, එහි විකිණීම සඳහා පදම් කළ අරක්කු ප්‍රවාහණය නොකළ යුතුය.

(2) තැබෑරුමක පදම් කළ අරක්කු විකිණීම කළ යුත්තේ ද සිල්ලරට බෝතල්වලින් අරක්කු විකුණන ආකාරයෙන් ම, ඒ ඒ නියෝග හා සීමා කිරීම යටතේය.

(3) බෝතලයේ ලේබලයෙහි සඳහන් මිළට අධික මිළකට කිසිවෙකුට පදම් කළ අරක්කු නොවිකිණිය යුතුය.

27. **විකිණීම හා ප්‍රවාහනය පිළිබඳ සීමාව.**—මුළු දිවයිනේ ම හා සාමාන්‍ය යෙන් මිලයට ගන්නන් සම්බන්ධයෙන් සිල්ලරට විකිණීමේ සීමාව ඉම්පීරියල් ගැලුමකින් තුනෙන් එකක් වන අතර, තනි බලය ලත් තැනැත්තා විසින්, වලංගු අවසර පත්‍රයකින් හෝ ප්‍රවේශ පත්‍රයකින් හෝ හැර, එකී ප්‍රමාණයට වඩා වැඩිපුර අරක්කු ඉවත ගෙන යාම හෝ යම් විටක යමෙකුට විකිණීම හෝ නොකළ යුතුය.

28. **රටබීම ස්ථානවල හෝ සුරාබදු කොමසාරිස් විසින් විශේෂයෙන් බලය දෙන ලද වෙනත් ස්ථානවල හෝ විකිණීම සඳහා පදම් කළ අරක්කු හැර අනිකුත් අරක්කු සැපයීමේ තනි අයිතිය, එවැනි ස්ථාන, තනි බලය ලත් තැනැත්තාට වෙන් කිරීම.**—(1) මීට යාකොට ඇති ' ආ ' උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් වූ සෑම තැබෑරුමකම තනි බලය ලත් තැනැත්තා විසින් තොග අරක්කුවලින් හෝ සීල් බෝතල් අරක්කු වලින් හෝ අවස්ථා වේ හැටියට පදම් කළ අරක්කු හැර අනිකුත් අරක්කු සැපයීමේ තනි අයිතිය සඳහා නීතියෙන් බලය දී ඇති විකුණුම් මිළ ප්‍රමාණය අනුව ගෙවීමෙන් අරක්කු ප්‍රවාහණය සඳහා සුරාබදු අධිකාරී, ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් පෙන්වීමෙන් ඒ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් වූ ඒ ඒ තැබෑරුම් ඉදිරියෙන් දක්වා තිබෙන රටබීම ස්ථානයන්හි හෝ ඒ පෙදෙස ඇතුළතම (රටබීම විකිණීම සඳහා බලපත්‍ර දරන්නා වූ හෝ නොදරන්නාවූ) එහෙත් අරක්කු විකිණීම සඳහා වූ මෙම කොන්දේසි ප්‍රසිද්ධ කිරීමෙන් පසුව බලපත්‍ර දිය හැකි එවැනි වෙනත් ස්ථානවල විකිණීම පිණිස, සුරාබදු කොමසාරිස් විසින් කලට නියම කරන ප්‍රමාණවලට අඩු නොවන ප්‍රමාණවල පදම් කළ අරක්කු හැර අනිකුත් සැපයීමේ තනි අයිතිය එකී තනි බලය ලත් තැනැත්තාට ඇත්තේය.

(2) තනි බලය ලැබූ තැනැත්තා විසින් රටබීම ස්ථානයකට හෝ බල පත්‍රයෙන් අවසර දී ඇති වෙනත් ස්ථානයකට හෝ පදම් කළ අරක්කු හැර අනිකුත් අරක්කු සපයනු ලබන කල්හි අරක්කු විකිණීම සම්බන්ධයෙන් තමාට ඇති තනි බලය ආරක්ෂා කරගනු පිණිස, එකී රටබීම හෝ අනෙක් අවසර ලත් ස්ථානයේ හෝ පදම් කළ අරක්කු හැර අනිකුත් අරක්කු විකිණීම සඳහා දී ඇති විශේෂ බලපත්‍රයේ කොන්දේසිවලින් සැලසී ඇති, පරිපාල නාත්මක අයිතිවාසිකම් ඔහු කෙරෙහි තිබිය යුතු වන්නේය.

(3) මීට යාකොට ඇති ' ආ ' උපලේඛනයෙහි සඳහන් රටබීම (ඉවත ගෙනයාම සඳහා) සිල්ලරට විකිණීමේ බලපත්‍ර හා තානායම් බලපත්‍රලාභීන්ට හෝ රට බීම (ඉවත ගෙනයෑම සඳහා) සිල්ලරට විකිණීමේ බලපත්‍ර හා තානා යම් බලපත්‍ර නිකුත් කරනු ලැබූ තැනැත්තාට හෝ වෙන යම් තැනැත්තකුට සීල් බෝතල් අරක්කු පමණක් විකිණීම සඳහා විශේෂ බලපත්‍ර සුරාබදු කොම සාරිස් විසින්, සිය අභිමතය පරිදි නිකුත් කරනු ලැබේ. එකී බලපත්‍රලාභීන් විසින් ඒ අරක්කු, බෝතල්වලින් පමණක් හා තනි බලය ලත් තැනැත්තා ගෙන් හෝ යථා පරිදි බලපත්‍ර ලබා පදම් කළ අරක්කු නිෂ්පාදනය කරන් නෙකුගෙන් හෝ පමණක් ලබාගත යුතුය. අරක්කු බෝතල් විවෘත කොට වීදුරු ගණනේ අරක්කු විකිණීමට කැමති සිල්ලරට අරක්කු විකුණන භෝජනශාලාවලට වුවමනා වුවහොත් එසේ විවෘත කළ බෝතල්වලින් අරක්කු සිල්ලරට විකිණීම පිණිස පමණක් විශේෂ බලපත්‍ර සුරාබදු කොම සාරිස් විසින්, සිය අභිමතය පරිදි නිකුත් කළ හැකිය. රට බීම (ඉවත ගෙන යෑම සඳහා) සිල්ලරට විකිණීමේ බලපත්‍රලාභීන්, බෝතල් විවෘත කර අරක්කු සිල්ලරට විකිණීමට කැමති භෝජනශාලා හා තානායම් බලපත්‍ර ලාභීන් හැර, රට බීම විකිණීමේ බලපත්‍ර නිකුත් කරනු ලැබූ සියළුම තැනැත් තන්ට (මීට යාකොට ඇති ' ආ ' උපලේඛනයේ සඳහන් වූ හා බලපත්‍ර නිකුත් කරනු ලැබූ තැනැත්තන්ට) තොග අරක්කු පමණක් විකිණීම සඳහා විශේෂ බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, එම බලපත්‍රලාභීන් විසින් ඒ අරක්කු තොග වශයෙන් පමණක් හා තනි බලය ලත් තැනැත්තාගෙන් පමණක් ලබා ගත යුතුය.

(4) තනි බලය ලත් තැනැත්තා විසින්, එකී රට බීම බලපත්‍රධාරීන්ට හා අනෙකුත් අයට අවස්ථාවේ හැටියට, අවශ්‍ය තොග අරක්කුවලින් හෝ සීල් බෝතල්වලින් හෝ සැපයිය යුතුය. බලපත්‍රධාරීන්ට අවශ්‍ය යම් වර්ගයක අරක්කු තනි බලය ලත් තැනැත්තාගේ තැබෑරුමෙහි ගබඩා කර නොමැති නම්, එසේ බලපත්‍රධාරීන්ට වුවමනා වන එම වර්ගවල අරක්කු ඔහු විසින් රජයේ ගුදමින් ලබාගෙන, ඔවුනට සැපයිය යුතුය.

(5) ප්‍රදන ලාභියා විදේශීය මත්පැන් බලපත්‍රධාරීන්ට අරක්කු තොග වශයෙන් සපයන විට, බලපත්‍රධාරියෙකු වෙත නිකුත් කරනු ලබන ඕනෑම අරක්කු තොගයකින් නොකැඩිය හැකි අරක්කු සැම්පලයක් සපයනු පිණිස, ප්‍රදනලාභියා, හෝ ඔහුගේ බලයලත් වෙළඳ සේවකයා ඊට ගෙවන මුදල බාරගෙන බලපත්‍රධාරියෙකු වෙත නිකුත් කරනු ලැබූ එක් එක් තොගයෙන් ඩ්‍රෑම් අට බැගින්, (බලපත්‍රධාරියා විසින් සැපයිය යුතුවූ) මූඩිය සහිත පිරිසිදු බෝතලයකට වත්කර එය කඩා වෙනස් කළ නොහැකි වනු පිණිස එහි මූඩිය මෙන්ම, එයට ඇලවිය යුතුවූ, දිනයත් අරක්කු නිකුත් කරන පුද්ගලයා ගේ අත්සනත් දරන ලේබලයත් මුද්‍රා තැබිය යුතුය. එවැනි සාම්පල් බෝතල විදේශීය මත්පැන් බලපත්‍රධාරියා විසින් දරන අරක්කු විකිණීමේ විශේෂ බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූලව තබාගෙන විකිණීම සඳහා බලපත්‍ර ධාරියාට හෝ අරක්කු ගෙනයන ඔහුගේ නියෝජිතයාට දිය යුතුය.

29. **තනි බලය ලත් තැනැත්තා විසින් අරක්කුවල ගණන් හිලව් තබාගත යුතු බව, අපතේ යෑම් වෙනුවෙන් ඉඩ හරින ප්‍රමාණය.**—තනි බලය ලත් තැනැත්තා විසින් තමා මිළයට ගන්නා සියලුම අරක්කු පිළිබඳව ගණන් හිලව් තබාගත යුතුය. අපතේ යෑම් වෙනුවෙන් ඉඩ හරින ප්‍රමාණය වූකලි,

තොග ගණන් ගැනීමට විධිමත් අවසරය ලැබූ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු විසින් අවසාන වරට තොග ගණන් ගත් තැන් පටන් මිළයට ගත් සියලුම අරක්කුවලින් සියයට දෙකකට වඩා කිසිම කරුණක් නිසාවත් වැඩි නොවිය යුතුය.

30. **නියෝජිතයාගේ ක්‍රියා කලාපය ගැන තනි බලය ලත් තැනැත්තා වග කිය යුතු බව.**—තනි බලය සම්බන්ධයෙන් තම නියෝජිතවරුන් හා සේවකයින් කරන සියලු කටයුතු ගැන තනි බලය ලත් තැනැත්තා වග කිය යුතුය.

31. **(අ) තනි බලය අන් අයෙකුට පැවරිය නොහැකි බව.**—සුරාබදු කොමසාරිස්ගේ අනුමතිය කලින් ලබාගෙන තිබුණොත් මිස අන් අයුරකින් මේ තනි බලය කිසිවකුට පැවරිය නොහැක.

(ආ) ප්‍රදනලාභියකු අරක්කු තැබෑරුම් පවත්වාගෙන යෑම සඳහා ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුගේ මුදලින් හෝ වෙනයම් කිසි ක්‍රමයකින් නියම ලෙස හෝ අනියම් ලෙස ආධාර ලබන බව යම්කිසි අවස්ථාවක ඔප්පු වුවහොත්, ඒ ප්‍රදනලාභියාට දෙනු ලැබූ වරප්‍රසාදය අවලංගු හා බල රහිත බව එකෙනෙහි ම ප්‍රකාශ කළ යුතුය.

32. (1) (අ) **රජයට අයවිය යුතු මුදල් ආදිය නිසා, බලපත්‍ර හා තනි බලය අවලංගු කිරීම.**—යම්කිසි කොටස් මුදලක් හෝ ගැනුම් මුදලේ නොහොත් රේන්දයේ කොටස් මුදලක පංගුවක් හෝ බෝතල සඳහා අතිරේක ඇප ආධානයක් වශයෙන් ඉල්ලූම් කළ තව මුදලක් හෝ 16 (3) හා 18 වෙනි කොන්දේසි යටතේ, අතිරේක නිකුත් කිරීමේ මිල වශයෙන් හෝ තමාට දෙන ලද මේ තනි බලය හෝ බලපත්‍රය හෝ සම්බන්ධයෙන් රජයට අයවිය යුතු අන්කිසි මුදලක් හෝ එය ගෙවිය යුතු දිනට පසු ද, නොගෙවා ඉතිරිව ඇතොත් හෝ සුරාබදු අධිකාරිට අවශ්‍යයයි හැඟෙන පරිදී ප්‍රාදේශීය අවශ්‍යතාවය සපුරාලනුවස් මෙම තැබෑරුම් බලපත්‍රය යටතේ විකිණිය හැකි නොයෙක් වර්ගවල සීල් බෝතල්, අරක්කු හෝ නොයෙක් වර්ගවල තොග අරක්කු වලින් හෝ අඩුම ප්‍රමාණයන් සෑම වේලාවකදීම තබා ගැනීමට තනි බලය ලත් තැනැත්තා අපොහොසත් වුවහොත්, තනි බලය ලැබූ තැනැත්තා විසින් මෙම කොන්දේසි හා ඔහුට නිකුත් කළ බලපත්‍රයේ කොන්දේසි කඩකළ අයෙකු වශයෙන් සලකනු ලැබේ. එවිට, රජයේ දිසාපති හට වෙන කිසිම නීති මාර්ගයක් අනුගමනය නොකොට, (1) තනි බලය ලැබූ තැනැත්තාට දෙන ලද බලපත්‍රයේ හෝ බලපත්‍ර, සුරාබදු ආඥපනතේ 27 වැනි වගන්තියේ විධිවිධානවල ප්‍රකාර, කලකට අවලංගු කිරීමට හෝ සඳහටම අවලංගු කිරීමට හෝ (2) බලපත්‍රධාරියාගේ ම වගකීම පිට, බලපත්‍රය හෝ තනි බලය තමා අතට ගන්නා බවට, තමා අදහස් කරන බව ලිපියකින් බලපත්‍රධාරියා, වෙත හෝ තනි බලය ලත් තැනැත්තා වෙත ලියා යවා දින පහළොවක් හෝ ඇතුළත දී බලපත්‍රය හෝ තනි බලය රාජසන්තක කරන ලද්දේ යයි ප්‍රකාශ කොට, එකී ආඥපනතේ 31 වෙනි වගන්තියේ විධිවිධානයන්ට අනුව වගකීම සහ අලාභයට තනි බලය ලත් තැනැත්තා යටත් කොට, ඒ බලපත්‍රය නැවත වරක් නිකුත් කිරීමට හෝ නැවත විකිණීමට හෝ බලය ඇත්තේ ය.

පූර්වෝක්ත 9 වෙනි කොන්දේසියේ විධිවිධාන පරිදී, ඇප මුදල රාජසන්තක කිරීමට රජයේ දිසාපතිට ඇති බලතල වලට මේ කොන්දේසියෙන් කිසිම අන්දමක අවහිරයක් නොවන්නේ ය. රජයේ දිසාපති විසින් පූර්වෝක්ත ප්‍රකාරයට යම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙන කල්හි, එසේ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජයට දැරීමට සිදුවන කවර පාඩුවක් වුවද, තනි බලය ලත්, තැනැත්තාට ලැබිය යුතුව තිබෙන මුදල් වලින් හෝ, මේ තනි බලය හෝ වෙන යම් තනි බලයක් හෝ මේ තනි බලය ලත් තැනැත්තා නොහොත් තැනැත්තන් සහ රජය අතර පවත්නා කොන්ත්‍රාත්තු හෝ සම්බන්ධයෙන් එකී තනි බලය ලත් තැනැත්තා හෝ ඔවුන්ගෙන් යම් කෙනෙකුට හෝ ලැබිය යුතුව ඇති මුදල් වලින් හෝ එසේ නැත්තම් අන් කවර ආකාරයකින්, වුවද ගනුදෙනුවක් පිට එකී තනි බලය හිමි තැනැත්තාට හෝ තැනැත් තාට, රජයෙන් ලැබිය යුතුව ඇති වෙන යම් මුදලකින් හෝ අයකර ගැනීමට රජයට පිළිවන.

(ආ) **අවලංගු කළ බව හැඟවීම හෝ දැන්වීම් ආදිය.**—එකී 27 වෙනි වගන්තිය යටතේ කරන ලද තාවකාලික අවලංගු කිරීමක් හෝ සදකාලික අවලංගු කිරීමක් හෝ සම්බන්ධයෙන් දැන්වීමක් හෝ එකී 31 වෙනි වගන්-තියට යටතේ කරන ව්‍යවස්ථාපිත දැන්වීමක් හෝ විධානයක් හෝ දිසාපතිට මැනවයි හැඟෙන පරිදිදෙන්, තනි බලය ලත් තැනැත්තාගේ අතටම හෝ 9 (4) වෙනි කොන්දේසිය යටතේ ඔහු නියම කොට ඇති තැපැල් කාර්‍යාල යට හෝ තැපැල් ලිපිනයට හෝ විධිවූ ප්‍රකාර තැපෑලෙන් යැවීමට පිළිවන.

(2) **තනි බලය අවලංගු කිරීමත් එය නැවත විකිණීමේත් අතර කාලය තුළදී එම බලය අනෙකෙකුට පැවරීම.**—රජයේ දිසාපති විසින් යම් බලපත්‍ර යක් අවලංගු කරනු ලැබුවහොත්, එම තනි බලය අවලංගු කිරීමත්, නැවත එය විකිණීමත් අතරතුර වූ යම්කිසි කාල පරිච්ඡේදයක් වෙනුවෙන්, තමා අනුමත කරන යම් කිසිවකුට, එම තනි බලය පැවරීමට දිසාපතිට බලය තිබේ. මේ සඳහා තමාට සුදුසු යයි හැඟෙන යම් කොන්දේසි අනුව එකී අනුමත කළ අයට තාවකාලික බලපත්‍රයක් නිකුත් කළ හැක.

33. **හානියක් හෝ අලාභයක් හෝ සඳහා රේන්ද කුලිය අඩු කිරීමක් හෝ වන්දියක් හෝ නොගෙවන බව.**—(1) මෙම කොන්දේසිවලින් සුරා බදු කොමසාරිස්ට පවරන ලද බලතලවල ප්‍රකාර, අවංක අදහසින් කරන ලද්දවූ හෝ මොනයම් දෙයක් ගැන හෝ එසේ කරන ලද්දවූ හෝ නොකර හරින ලද්දවූ හෝ යම් දෙයක් නිසා සිදු වූ අලාභයක් හෝ හානියක් ගැන, ලංකාණ්ඩුවටත් සුරාබදු කොමසාරිස්ටවත් විරුද්ධව කිසිම උසාවියක නඩු පැවරීමක් හෝ වෙනයම් ක්‍රියා මාර්ගයක් හෝ නොගත යුතුය.

(2) තනි බලය ලත් අය විසින් තැබෑරුමක වටිනාකම නියම ප්‍රමාණයට වැඩියෙන් ගණන් බලන ලදයි කියා හෝ වෙනයම් කරුණක් නිසා හෝ කරන ඉල්ලීමක් වෙනුවෙන් තනි බලය සම්බන්ධයෙන් ගෙවිය යුතු රේන්ද මුදලේ කිසිම අඩු කිරීමක් කරනු නොලැබේ.

(3) (අ) යුද සෙබලුන් සංචාරයේ යෙදී සිටින කාලය තුළ දී, හෝ තම තැබෑරුම් හෝ තැබෑරුම් අසල යුද සෙබලුන් කඳවුරු බැඳගෙන සිටින කාලය තුළදී, හෝ යම්කිසි කැරළි කෝලාහලයක්, සිවිල් නීති කඩ කිරීමක් හෝ එසේ කැරළි කෝලාහලයක්, සිවිල් නීති කඩ කිරීමක් හෝ සාමය කඩ කිරීමක් ඇති වෙතැයි යන බියක් පවතින විටක දී හෝ ජන්දවිමසීමක් පවත්නා විටකදී හෝ ලිඛිත නියෝගයකින් යම් ප්‍රදේශයක් එකලට රෝගස්ථ ප්‍රදේශයක් කොට ප්‍රකාශ කිරීම හේතුවෙන් එම ප්‍රදේශය තුළ හෝ ඒ අසළ තැබෑරුම හෝ තැබෑරුම් පිහිටුවා තිබීමෙන් තැබෑරුම හෝ තැබෑරුම් වැසීමේ හේතු කොටගෙන හෝ,

(ආ) මෙම කොන්දේසි යටතේ තනි බලය විකිණීමෙන් පසු දෙන ලද බලපත්‍රයක් පිට අලුතෙන් යම්කිසි අරක්කු තැබෑරුමක් හෝ රා තැබෑරුමක් හෝ අරක්කු, රා හෝ රටබීම විකිණීම පිණිස වතු සුරාසැලක් හෝ වෙනයම් කවර වර්ගයක් හෝ පන්තියක රටබීම බලපත්‍රයක් යටතේ මෙරට බීම හෝ රට බීම විකිණීම සඳහා බලපත්‍ර ලත් ස්ථානයක් විවෘත කිරීම හේතු කොට ගෙන හෝ,

(ඇ) සහකාර සුරාබදු කොමසාරිස් විසින් නිකුත් කරන ලද මැදීමේ විශේෂ බලපත්‍ර පිට, විකිණීම සඳහා නොව වෛද්‍යෝපදේශ අනුව තනි පුද්ගලයෙකුට ගෘහ පරිභොගය සඳහා රා සෑදීමට හෝ ලබා ගැනීම හේතු කොටගෙන හෝ,

(ඈ) රා සෑදීමේ කර්මාන්තය කරගෙන යාමේ දී රා පාවිච්චි කරන බලපත්‍ර ලත් කර්මාන්ත ශාලාවට සැපයීම සඳහා, මෙයින් තනි බලය දෙන ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත රා සෑදීම හා බෑම හේතුකොට ගෙන හෝ,

(ඉ) රා බෝතල් පිරවීමට හා බෝතල් රා තොග ගණනේ රා තැබෑරුමේ සිල්ලරට විකිණීම හේතුකොට ගෙන හෝ,

(ඊ) බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නැතිව, සීමා රහිතව ගස් මැදීම හා මී රා සෑදීම හා බෑම හේතුකොට ගෙන හෝ,

(උ) ඉහතකී 27 වෙනි කොන්දේසිය අනුව, විශේෂ අරක්කු බලපත්‍ර නිකුත් කිරීම සුරාබදු කොමසාරිස් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන හෝ,

(ඌ) තනි බලය දෙන ලද ප්‍රාදේශීය කොට්ඨාශය තුළ රා සඳහා ගස් බදු ක්‍රමය ඉදිරිපත් කිරීමේ හේතුවෙන් හෝ,

(එ) තනි බලය දෙන ලද ප්‍රාදේශීය කොට්ඨාශය අතරතුර අනෙක් මත් පැන් වර්ග නිපදවීමට හා/හෝ විකිණීමට බලපත්‍ර නිකුත් කිරීම හේතුකොට ගෙන හෝ,

(ඒ) අරක්කු විකිණීමේ මිළ වැඩි කිරීම හේතුකොට ගෙන හෝ,

(ඔ) වෙන යම්කිසි හේතුවක් නිසා හෝ,

තමාට යම්කිසි පාඩුවක් විඳින්නට වූයේ යයි, තමාගෙන් රජයට අය විය යුතු වූ ද, තමා විසින් රජයට ගෙවිය යුතු වූ ද කිසිම මුදලක් අඩු කරවා ගැනීමටවත්, අඩුකර ගෙවීමටවත් ඉල්ලීමක් කිරීමට තනි බලය ලත් තැනැත්තාට අයිතිවාසිකමක් නැත.

34. **තනි බලය අවසානවීම.**—

(අ) තනි බලය දෙනු ලැබූ කාල පරිච්ඡේදය ඉකුත් වූ විට හෝ,

(ආ) තනි බලය දෙනු ලැබූ තැනැත්තා මැරුණු විට හෝ,

(ඇ) ඒ තනි බලය සම්බන්ධ කොන්දේසි වලින් යමක් කඩ කළ විට හෝ තනි බලය අවසාන වන්නේ ය.

එහෙත් තනි බලය ලත් අය මැරුණහොත්, මේ තනි බලය දෙන ලද්දේ යම් කාල පරිච්ඡේදයක් වෙනුවෙන් ද, ඒ කාල පරිච්ඡේදය අවසන් වන තෙක්, ඒ බලය භුක්ති විඳගෙන යෑමට රජයේ දිසාපති විසින් ඒ තනි බලය ලත් තැනැත්තාගෙන් නීත්‍යානුකූල උරුමක්කාරයින්ට හෝ ඒ දේපලවල අද්මිනිස්ත්‍රාසි බලකාරයාට, හෝ, සිය අභිමතය පරිදී ඉඩ දිය හැක.

35. **බලපත්‍ර ආපසු භාර නොදිය යුතු බව.**—රජයත් තනි බලය ලත් තැනැත්තාත් අතර වූ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරනු වස්, සුරාබදු ආඥපනතේ 19 (2) වෙනි වගන්තියේ ප්‍රකාර නොමිලයේ දෙන්නාවූ ඉහත දක්වූ 14 (2) වැනි කොන්දේසියේ සඳහන් වූ බළපත්‍රය හෝ බලපත්‍ර කල් ඇතුව රජයේ දිසාපතිගෙන් ලියවිල්ලකින් ලත් අවසරය ඇතිව මිස, එකී ආඥපනතේ 29 වෙනි වගන්තිය යටතේ තනි බලය ලත් තැනැත්තා විසින් භාර නොදිය යුතුය.

**ලංකාණ්ඩුව**

**අරක්කු රේන්ද පිළිබඳ ටෙන්ඩර ආකෘති පත්‍රය යි**

(3 වැනි කොන්දේසිය)

*දිස්ත්‍රික්කයේ පිහිටි

† ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත අරක්කු සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිලට ගැනීම සඳහා වූ ටෙන්ඩර පත්‍රයයි.

ආණ්ඩුවේ දිසාපති වෙතටයි.

දින දරන ඔබගේ දැන්වීම් අනුව ඔක්තෝබර් මස 1 වැනි දින පටන් සැප්තැම්බර මස 30 දින වන තෙක් එක් අවුරුද්දක කාල පරිච්ඡේදය තුළ ඉහත සඳහන් ප්‍රාදේශීය කොට්ඨාශය ඇතුළත අරක්කු සිල්ලරට විකිණීමේ තනි අයිතිය, රුපියල් (ගණන අකුරෙන් ලියන්න).

ක මුදලකට (අරක්කු වලට ආණ්ඩුව අය කරන මුදල හා සුරාබද්ද හැරයි) මිලදී ගැනීමට මෙහි පහත අත්සන් කරන මම/අපි මෙයින් ඉල්ලුම් කරමි/මු. වචන සහ ඉලක්කම් අතර යම් වෙනසක්, ඇති වූ විටකදී, ඉහලම ගණන නිවැරදි ගණන සේ තීරනය කරනු ලැබේ.

මම/අපි කච්චේරියේ රුපියල්

මුදලක් තැන්පත් කෙළෙමි/මු. ඒ වෙනුවෙන් වැනි අංකය හා

වැනි දිනය දරන කුවිතාන්සිය මීට අමුණා එවා

ඇත.

මගේ/අපගේ රුපියල් ක වත්කම දක්වෙන

සහතිකය දිනෙන් අවසන් වන අංක දරණ

අරක්කු තැබෑ රුමේ රේන්දය පිළිබඳව

දිසාපති වෙත රඳවා ගෙන ඇත.

අරක්කු රේන්දය විකිණීම පිළිබඳ කොන්දේසි මාලාවේ 6 (1) හෝ 6 (2) වැනි විශේෂ කොන්දේසියේ සඳහන් කවර විධිවිධානයක් වත් යටතේ මා/අප නුසුදුස්සකු/නුසුදුස්සන් වී නැති බව මම/අපි මෙයින් ප්‍රකාශ කරමි/මු.

අත්සන :

ලිපිනය :

සාක්ෂිකාරයෝ :

1.

2.

---

*දිස්ත්‍රික්කයේ නම ලියන්න †තැබෑරුමේ නම ලියන්න.

සැ.යු.—(1) රුපියල් ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් මේ ටෙන්ඩර පත්‍රයට ඇමිණිය යුතු ය. මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් නො අමුණා එවන කිසි ම ටෙන්ඩරයක් බාරගනු නො ලැබේ. අරක්කු රේන්ද විකිණීම පිළිබඳ වූ 6 වැනි 10 වැනි කොන්දේසිවල විධිවිධාන වලට යටත් ව, රුපියල් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

(2) මේ ආකෘති පත්‍රය ලියුම් කොපුවක බහා, සීල් තබා, ටෙන්ඩරයට අදළ අරක්කු තැබෑරුමේ නම හා අංකය ලියුම් කොපුවේ වම් පැත්තේ මුදුන් කෙළවරේ ලියා, ටෙන්ඩර බාර ගන්නා අවසාන වේලාව ඉකුත් වී යන්නට කලින් කච්චේරියට ලැබෙන ලෙස කච්චේරියේ ටෙන්ඩර පෙට්ටියට දැමිය යුතු ය. නැත හොත් ආණ්ඩුවේ දිසාපතිට හෝ කාර්යාල සහකරුට හෝ බාර දිය යුතු ය. නැතහොත් රෙජිස්ටර තැපෑලෙන් එවිය යුතු ය.

(3) එක් එක් තැබෑරුම වෙනුවෙන් එක් එක් ආකෘති පත්‍රය බැගින් පාවිච්චි කළ යුතු ය.

## ගිවිසුම් පත්‍රය

(9 (1) (අ) කොන්දේසිය)

යට කී කොන්දේසි පිට, රුපියල් ———ක මුදලකට, මෙහි ඉහත සඳහන් තනි බලය———පදිංචි———වන මට/අපට මෙදින මුළු මනින්ම භාරදෙන ලද බවත්, එකී කොන්දේසි පිළිපැදීමට මා/අප මෙයින් සම්පූර්ණයෙන් ම බැඳෙන බවත් දන්වමි/දන්වමු.

තනි බලධරයා/යෝ.

සාක්ෂිකාරයෝ :

(1) ———.

(2) ———.

මේ කොන්දේසි මාලාවේ 9 (1) (අ) වෙනි කොන්දේසිය යටතේ ඇප ආධානය වශයෙන්———විසින් හා———විසින් ගෙවන ලද මුදල වන රුපියල්———බාර ගත් බව මෙයින් දන්වමි.

..........................

රජයේ දිසාපති.

## බැඳුම්කර ආකෘති පත්‍රය

(9 (1) (ආ) වැනි කොන්දේසිය)

සියලුදෙනා විසින් මෙයින් දැනගත යුතුයි.

................................ පදිංචි ................................ වන මම*/අපි ප්‍රතාපවත් දෙවෙනි එලිසබෙත් රාජිණින් වහන්සේට ද, උන්වහන්සේගේ උරුමක්කාරයන්ට හා අනුප්‍රාප්තිකයන්ට ද ලංකාවේ වළංගු මුදලින් රුපියල්......... නිසි ලෙස හා සත්‍ය ලෙස ගෙවීමට මම/අපි ද, මගේ*/අපගේ උරුමක්කාර, බලකාර, පරිපාලක හා පෞද්ගලික නියෝජිත යින් සියලු දෙනාද, ඔවුන් එක් එක්කෙනා ද මෙයින් බැඳ තබමි/මු. තවද මේ බැඳුම්කරය යටතේ අයවිය යුතු හා ගෙවිය යුතු සියලු මුදල් එකී රාජිණින් වහන්සේට හා උන්වහන්සේගේ උරුමක්කාරයින්ට හා අනුප්‍රාප්තිකයන් ද නිසි පරිදි ගෙවීම ආරක්ෂා කිරීම පිණිස එකී................................වන මා*/අප විසින්................වෙත 19....................මස............වැනි ද තැන්පත් කරන ලද රුපියල්....................වන මුළු මුදල ම එකී රාජිණින් වහන්සේට සහ උන්වහන්සේගේ උරුමක්කාරයන්ට හා අනුප්‍රාප්තිකයන්ට ද විශේෂ වශයෙන් උගස් කොට, හිමි කොට මෙයින් පවරා දෙමි*/දෙමු.

19...........මස...........වැනි දින මෙදින එකී.................විසින්..... .........දී අත්සන් කරන ලදී.

................................සඳහා මෙහි ඉහත සඳහන් ලෙස බැඳී සිටින..................එකී රාජිණින් වහන්සේ හා උන්වහන්සේගේ උරුමක් කාරයන් හා අනුප්‍රාප්තිකයන් වෙනුවෙන් ක්‍රියාකරන................ස්මග 19........මස...........වැනි දින දරන "ඒ" අක්ෂරය යොද මීට යා කොට ඇත්තා වූ ද කොන්ත්‍රාත්තුවට බැඳී ඇති හෙයින් දන්වීමේ ලියා අත්සන් කර දෙන බැඳුම්කරයේ කොන්දේසි නම්, එකී කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් එකී......................විසින් කළ යුතු වූ, පිළිපැදිය යුතු වූ සහ සම්පූර්ණ කළ යුතු වූ ද, එකී කොන්දේසිවල එක් එක් වගන්තිය සහ සියළුම වගන්ති, මනා ලෙස හා අවංක ලෙස ඉටු කොට, පිළිපැද සම්පූර්ණ කළහොත් එවිට මේ බැඳුම්කරය අවලංගුව නිශ්ප්‍රභා විය යුතු අතර, එසේ නොකළහොත් මේ බැඳුම්කරය සම්පූර්ණ බල සහිතව වලංගු විය යුතු ය.

ප්‍රදන ලාභියා/ලාභිනු

---

රජයේ දිසාපති.

සාක්ෂිකරුවෝ :

(1)

(2)

---

*නුවුවමනා වචන කපා දමපන.

## දන්වීම සඳහා ලිපිනය

(9 (4) වෙනි කොන්දේසිය)

9 (4) වෙනි කොන්දේසියෙන් අවශ්‍ය වන පරිදි, මෙහි ඉහත දක්වූ තනි බලයට සම්බන්ධ සියලුම දන්වීම් හා කැඳවීම් නියෝග යැවීම සඳහා තැපැල් කාර්යාලය/තැපැල් ලිපිනය වශයෙන් මෙහි පහත දක්වෙන තැපැල් කාර්යාලය/තැපැල් ලිපිනය තෝරා ගත් බවත්, එයට ලිපිනය ලියා තැපැල් කළ යුතු බවත් මෙහි පහත අත්සන් කරන මම/අපි දන්වමි/දන්වමු.

තනි බලධාරියා/යෝ

සාක්ෂිකරුවෝ :

(1) ———.

(2) ———.

## "අ" උපලේඛනය

(13) (2) වැනි කොන්දේසිය බලන්න)

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම | බෝතල් සඳහා අතිරේක ඇප ආධානය වශයෙන් ගෙවිය යුතු මුදල | |
|---|---|---|---|
| (1) | (2) | (3) | |
| | **කොළඹ නාගරික සභා සීමාව** | | |
| | | රු. | ශ. |
| 2 | කොල්ලුපිටිය | 7,500 | 0 |
| 3 | පිකරින්ස් පාර | 7,500 | 0 |
| 4 | ජම්පටා වීදිය | 3,000 | 0 |
| 5 | මෝදර | 3,000 | 0 |
| 6 | මාදම්පිටිය | 4,500 | 0 |
| 7 | fපර්ගියුසන් පාර | 3,250 | 0 |
| | **කොළඹ දිස්ත්‍රික්කය (නාගරික සභා සීමාවෙන් පිටත)** | | |
| 1 | දිගරොල්ල | 5,550 | 0 |
| 8 | තිඹිරිගස්යාය | 1,575 | 0 |
| 9 | කරගහමුණ පහළ | 1,500 | 0 |
| 10 | කෙරහෙපොකුණ | 1,125 | 0 |
| 11 | උස්වැටකෙයියාව | 295 | 0 |
| 12 | කඳාන | 1,575 | 0 |
| 13 | වැලිගම්පිටිය | 745 | 0 |
| 14 | කණුව | 3,060 | 0 |
| 15 | දඩුගම | 490 | 0 |
| 16 | බෝපිටිය | 295 | 0 |
| 17 | කැපුන්ගොඩ | 105 | 0 |
| 18 | සීදුව | 405 | 0 |
| 19 | කටුනායක | 405 | 0 |
| 20 | පිටිපන | 405 | 0 |
| 21 | කුරණ | 295 | 0 |

| අනුක්‍රමික අංකය (1) | තැබෑරුමේ නම (2) | බෝතල් සඳහා අතිරේක ඇප ආධානය වශයෙන් ගෙවිය යුතු මුදල (3) රු. | ශ. |
|---|---|---|---|
| 22 | බෝලවලාන | 1,500 | 0 |
| 23 | උඩයාර් තෝප්පුව | 1,125 | 0 |
| 24 | කුඩාපාඩුව | 630 | 0 |
| 25 | පෙරියමුල්ල | 300 | 0 |
| 26 | කඳවල | 490 | 0 |
| 27 | දලුවාකොටුව | 405 | 0 |
| 28 | කොච්චිකඩේ | 405 | 0 |
| 29 | ඇත්ගාල | 295 | 0 |
| 30 | හේන්මුල්ල | 340 | 0 |
| 31 | දගොන්න | 670 | 0 |

කළුතර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | කලමුල්ල | 3,445 | 0 |
| 2 | දියලගොඩ | 2,475 | 0 |
| 3 | බේරුවල | 2,475 | 0 |
| 4 | වලපොලපට්ටිය | 3,940 | 0 |
| 5 | නල්ලූරුව | 2,475 | 0 |

මහනුවර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | කොළඹ වීදිය | 7,305 | 0 |
| 2 | කටුකැලේ | 1,645 | 0 |
| 3 | වහුගේපිටිය | 1,125 | 0 |
| 4 | පුස්සැල්ලාව | 2,025 | 0 |
| 5 | හැටන් | 7,875 | 0 |
| 6 | කොටියගල | 4,345 | 0 |
| 7 | හර්තිස් | 2,205 | 0 |
| 8 | මස්කෙළිය | 4,905 | 0 |
| 9 | පුපුරැස්ස | 1,500 | 0 |

නුවරඑළිය දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | රම්බොඩ | 1,425 | 0 |
| 2 | පදියපැලැල්ල | 1,830 | 0 |
| 3 | හෝල්බෲක් | 5,625 | 0 |
| 4 | බඹරකැලේ | 5,625 | 0 |
| 5 | රාගල | 5,020 | 0 |

ගාලු දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | කටුගොඩ | 5,625 | 0 |
| 2 | හිනටිගල | 3,820 | 0 |

හම්බන්තොට දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | හම්බන්තොට | 4,980 | 0 |

යාපනය දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | ග්‍රෑන්ඩ් බසාර් | 5,250 | 0 |
| 2 | කරෙයූර් | 1,500 | 0 |
| 5 | වන්නන්කර්නි | 1,200 | 0 |
| 7 | වැල්වෙට්තුරේ | 3,750 | 0 |
| 8 | කයිට්ස් | 1,500 | 0 |

මන්නාරම් දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | පෙරියකඩෙයි | 1,720 | 0 |

වවුනියා දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | මුලතිවු... | 1,125 | 0 |
| 2 | මාන්කුලම් | 1,125 | 0 |
| 3 | වවුනියා | 2,250 | 0 |

මඩකලපුව දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | වාලච්චේනෙයි | 2,250 | 0 |
| 2 | ඉරාවුර් | 2,250 | 0 |
| 3 | කොඩ්ඩමුනෙයි | 1,465 | 0 |
| 4 | ඉරුවිල් | 2,250 | 0 |

අම්පාරේ දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | පෙරියනිලාවනෙයි | 5,625 | 0 |

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | නෙවිල් වීදිය | 2,320 | 0 |
| 2 | සෙන්ට්‍රල් රෝඩ් | 2,770 | 0 |
| 3 | උප්පුවෙලි | 295 | 0 |
| 4 | නිලාවෙලි | 295 | 0 |

| අනුක්‍රමික අංකය (1) | තැබෑරුමේ නම (2) | බෝතල් සඳහා අතිරේක ඇප ආධානය වශයෙන් ගෙවිය යුතු මුදල (3) රු. | ශ. |
|---|---|---|---|

කුරුණෑගල දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | කට්ටිමහන | 1,500 | 0 |
| 2 | දූනුකදෙනිය | 255 | 0 |
| 3 | යක්කල | 1,255 | 0 |
| 4 | කුරුණෑගල | 4,500 | 0 |
| 5 | මාවතගම | 1,125 | 0 |
| 6 | ගිරිඋල්ල | 1,500 | 0 |
| 7 | නාරම්මල | 1,500 | 0 |

පුත්තලම් දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | වේනෙයිකුඩිරිප්පුව | 1,650 | 0 |
| 2 | කුරුවිකුලම් | 1,125 | 0 |
| 3 | ටෙටපොලෙයි | 225 | 0 |
| 4 | කඳතොඩුව | 105 | 0 |
| 5 | මදුරන්කුලි | 490 | 0 |
| 6 | මංගලවේලි | 295 | 0 |
| 7 | කට්ටෙයිකාඩු | 105 | 0 |
| 8 | ගට්ටපනෙයි | 70 | 0 |
| 9 | මුන්ඩෙල් | 490 | 0 |
| 10 | ආඬිමුනෙයි | 180 | 0 |
| 11 | සොටටුපිටියවාඩි | 405 | 0 |
| 12 | ඒතාලෙයි | 370 | 0 |
| 13 | තාරක්කලේ | 295 | 0 |
| 14 | ඉහල මන්ඩලාන | 70 | 0 |

හලාවත දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 15 | උඩප්පුව | 295 | 0 |
| 16 | වැල්ලවෙල | 180 | 0 |
| 17 | රාජකදලුව | 490 | 0 |
| 18 | කරුක්කුපොනේ | 145 | 0 |
| 19 | දෙමටපිටිය | 145 | 0 |
| 20 | බණ්ඩාරවත්ත | 145 | 0 |
| 21 | පම්බල | 220 | 0 |
| 22 | අඹකඳවල | 70 | 0 |
| 23 | උදලවෙල | 405 | 0 |
| 24 | බැසාර වීදිය | 1,500 | 0 |
| 25 | වැව පාර | 1,500 | 0 |
| 26 | කොඩුවාව | 105 | 0 |
| 27 | මහවැව | 285 | 0 |
| 28 | කුඩාවැව | 225 | 0 |
| 29 | පහළ තල්ගස්ගාර | 70 | 0 |
| 30 | තල්විල | 105 | 0 |
| 31 | මුදුකටුව | 255 | 0 |
| 32 | දෙමටපිටිය | 70 | 0 |
| 33 | මොරකැලේ | 70 | 0 |
| 34 | කටුනේරිය | 255 | 0 |
| 35 | උල්හිටියාව | 295 | 0 |
| 36 | දූම්මලදෙනිය | 105 | 0 |
| 37 | බොරලැස්ස | 70 | 0 |
| 38 | වයික්කාල | 295 | 0 |
| 39 | නන්ජුන්ඩන්කරේ | 70 | 0 |
| 40 | තෝප්පුතොට | 330 | 0 |
| 41 | තඹරවිල | 295 | 0 |
| 42 | ලුනුසල | 405 | 0 |
| 43 | වෙන්නප්පුව | 405 | 0 |

අනුරාධපුර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | අනුරාධපුරය | 3,255 | 0 |

බදුල්ල දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | බදුල්ල | 3,780 | 0 |
| 2 | මඩුල්සීම | 2,115 | 0 |
| 3 | ලුනුගල | 2,250 | 0 |

රත්නපුර දිස්ත්‍රික්කය

| | | | |
|---|---|---|---|
| 1 | බලන්ගොඩ | 5,065 | 0 |
| 2 | පින්නවල | 540 | 0 |

## " ආ " උපලේඛනය

(28 වෙනි කොන්දේසිය බලන්න)

| (1)<br>අරක්කු තැබෑරුමේ අංකය සහ නම | (2)<br>වෙන් කරන ලද රට බීම ස්ථානය<br>කොළඹ නාගරික සහා සීමාව |
|---|---|
| අංක 3 තැබෑරුම, කොටහේන | සීමාසහිත මිලර්ස්, සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, කොළඹ කොටුව<br>සීමාසහිත කාර්ගිල්ස්, සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, කොළඹ කොටුව<br>සීමාසහිත කොළඹ ඇපෝතිකරිස් සමාගම, සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, කොළඹ කොටුව<br>හෝටෙල් මෙට්‍රෝපෝල්, කොළඹ කොටුව<br>බ්‍රවුන්ස් හෝටලය, කොළඹ කොටුව<br>රත්නගිරි හෝටලය, කොළඹ කොටුව,<br>ඩොමිනියන් හෝටලය, කොළඹ කොටුව<br>ලෝඩ් නෙල්සන් හෝටලය, කොළඹ කොටුව<br>බ්‍රිටිෂ් ඉන්දියා හෝටලය, කොළඹ කොටුව<br>ග්ලෝබ් හෝටලය, කොළඹ කොටුව<br>බ්‍රිස්ටල් හෝටලය, කොළඹ කොටුව<br>රටබීම තැබෑරුම, කොළඹ කොටුව<br>පී. සුප්පයියා නෝනා මහත්මිය, සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, උතුරු ස්කිනර් පාර<br>තානායම, වැකේ<br>තානායම, පාදුක්ක<br>සීමාසහිත බ්‍රෝඩි සහ සමාගම, රටබීම සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, කොළඹ කොටුව<br>සීමාසහිත ඩාර්ලි බට්ලර් සහ සමාගම, රටබීම සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, කොළඹ කොටුව<br>සී. ඊ. තේග්‍රිස්ගේ රටබීම සිල්ලර (ඉවත ගෙන යාමට) විකුණන සාප්පුව, කොළඹ කොටුව<br>සීමාසහිත ඒ. වී. කාසිචෙට්ටි සහ සමාගම, රටබීම (ඉවත ගෙන යාමට) විකුණන ස්ථානය, කොළඹ කොටුව<br>සීමාසහිත සිලෝන් ට්‍රේඩිං සමාගම, රටබීම සිල්ලරට (ඉවත ගෙන යාමට) විකුණන ස්ථානය, කොළඹ කොටුව<br>හොටෙල් ටැප්‍රොබේන්, කොළඹ කොටුව<br>සිලින්කෝ හෝටලය, කොළඹ කොටුව |
| අංක 5 තැබෑරුම, මෝදර | ඩොක්ලන්ඩ් හෝටලය, මෝදර<br>රටබීම තැබෑරුම, මෝදර |
| අංක 6 තැබෑරුම, මාදම්පිටිය | නැෂනල් ආපන ශාලාව, තොටලඟ<br>රටබීම තැබෑරුම, තොලටඟ<br>තානායම, හන්වැල්ල |
| අංක 2 තැබෑරුම, කොල්ලුපිටිය | හෝටෙල් ද යුනිවර්ස්, යූනියන් පෙදෙස, කොළඹ<br>සීමාසහිත ඔරියන්ටල් සමාජ සමාගම, කොළඹ 7<br>තානායම, අවිස්සාවේල්ල<br>තානායම, හෝමගම |

### කොළඹ දිස්ත්‍රික්කය (නගර සහා සීමාවෙන් පිටත)

| | |
|---|---|
| අංක 23 තැබෑරුම, උඩයාර් තෝප්පුව | කොරනේෂන් හෝටලය හා පිටියිකාව, මීගමුව<br>ප්‍රනාන්දු සහ ප්‍රනාන්දු මහතුන්ගේ ආපන ශාලාව, මීගමුව<br>රටබීම තැබෑරුම, ග්‍රීන් පාර, මීගමුව<br>ප්‍රනාන්දු සහ ප්‍රනාන්දු, සිල්ලරට (ඉවත ගෙනයාමට) විකුණන සාප්පුව, මීගමුව<br>ඇම්. ඇල්. ගෝමස් මහතාගේ සිල්ලරට විකුණන (ඉවත ගෙනයාමට) සාප්පුව<br>මීගමුව තානායම, මීගමුව (නව) |
| අංක 22 තැබෑරුම, බෝලවාන | ... ලැගුන් වීව් තානායම, මීගමුව |
| අංක 14, තැබෑරුම, කනුවන | ඊ. ජී. ජේ. සහ ඇම්. ආර්. සී. කාසිචෙට්ටි මහතුන්ගේ රටබීම ආපන ශාලාව, ජාඇල<br>ඊ. ජේ. ඊ. සහ ඇම්. ආර්. සී. කාසිචෙට්ටි මහතුන්ගේ රටබීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව), ජාඇල<br>තානායම, ජාඇල<br>තානායම, ගම්පහ |

| (1)<br>අරක්කු තැබෑරුමේ අංකය සහ නම | (2)<br>වෙන් කරන ලද රට බීම ස්ථානය<br>කොළඹ නාගරික සහා සීමාව |
|---|---|
| අංක 1 තැබෑරුම, දිගරොල්ල | රටබීම තැබෑරුම, මොරටුව<br>ටී. වී. ප්‍රනාන්දු සහ ටී. ජේ. ප්‍රනාන්දු මහතුන්ගේ සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, 91, ගාලු පාර, මොරටුව<br>තානායම, කැස්බෑව 3<br>තානායම, ලුනාව |
| අංක 10 තැබෑරුම, කරගහමුන පහළ | ... තානායම, මහර |
| අංක 24 තැබෑරුම, බසාර් වීදිය, හලාවත | අංක 2 රටබීම තැබෑරුම, හලාවත<br>ඇල්. ගෝමස් නෝනා මහත්මියගේ රටබීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, හලාවත |
| අංක 25 තැබෑරුම, වැව පාර, හලාවත | ... අංක 1 රටබීම තැබෑරුම, හලාවත<br>තානායම, හලාවත |

### පුත්තලම් දිස්ත්‍රික්කය

| | |
|---|---|
| අංක 1 තැබෑරුම, වෙනෙයි කුඩිරිප්පුව | ... තානායම, පුත්තලම |

### මහනුවර දිස්ත්‍රික්කය

| | |
|---|---|
| අංක 1 තැබෑරුම, කොළඹ විදිය | ලේකම්, සීමාසහිත මහනුවර ආපන ශාලා, කුවීන්ස් හෝටලය සහ පිටියිකාව, මහනුවර<br>ඇස්. ඩී. ඇස්. ප්‍රනාන්දු සහ ඒ. එච්. සිල්වා, හා ජේ. ඇස්. මලින්ග ප්‍රනාන්දු නෝනා මහත්මිය ඇතුළු මහතුන්, කාසල් හෝටලය සහ පිටියිකාව, මහනුවර<br>ඇස්. ඩී. ඇස්. ප්‍රනාන්දු සහ ඩී. ඇම්. ප්‍රනාන්දු රෝයල් හෝටලය හා පිටියිකාව, මහනුවර<br>ඩී. ඇෆ්. එච්. පෙරේරා, ටී. ඒ. එම්. ප්‍රනාන්දු කින්ස් හෝටලය සහ පිටියිකාව, මහනුවර<br>නිව් එම්පයර් හෝටලය සහ පිටියිකාව, මහනුවර<br>ඇම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු, ඇම්. පී. ඩී. කුරේ සහ ඇම්. ඩබ්ලිව්. ඇස්. කුරේ මහතුන්, වික්ටරි හෝටලය සහ පිටියිකාව, මහනුවර<br>ඇස්. ඇම්. පීරිස් නෝනා මහත්මිය, පීක්විව් හෝටලය, මහනුවර<br>රටබීම තැබෑරුම, අංක 7තේ කොට්ඨාශය, මහනුවර<br>රටබීම තැබෑරුම, අංක 5හේ කොට්ඨාශය, මහනුවර<br>සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, කොළඹ වීදිය, මහනුවර<br>ඒ. වී. කොස්තා මහතා, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, වෝඩ් වීදිය, මහනුවර<br>කාර්ගිල්ස් (ලංකා) මහතුන්, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, මහනුවර<br>ග්‍රීන් කැෆේ, රටබීම ආපන ශාලාව, මහනුවර<br>යූ. කේ. ඇඩ්මන්ඩ්, රටබීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, මහනුවර<br>හොටෙල් සූස්, මහනුවර<br>වාලට් ගෙස්ට් හවුස්, මහනුවර<br>වේල්ස් සිනිමා හල, මහනුවර<br>ඕඩියන් සිනිමා හල, මහනුවර<br>සීගිරි සිනිමා, කටුගස්තොට |
| අංක 2 තැබෑරුම, කටුකැලේ | රීගල් සිනිමා හල, මහනුවර<br>වෙම්බ්ලි සිනිමා හල, මහනුවර<br>කේ. පියදස, සිල්ලරට රටබීම විකුණන සාප්පුව, පේරාදෙනිය<br>තානායම, පේරාදෙණිය |
| අංක 4 තැබෑරුම, පුස්සැල්ලාව | තානායම, පුස්සැල්ලාව<br>රටබීම තැබෑරුම, පුස්සැල්ලාව<br>ඕ. කේ. දෙන් පැට්රික් සහ ඕ. කේ. ඇන්තනි රෝමෝල්ඩ්, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, පුස්සැල්ලාව |

| (1) අරක්කු තැබෑරුමේ අංකය සහ නම | (2) වෙන් කරන ලද රට බීම ස්ථානය |
| --- | --- |
| **මහනුවර දිස්ත්‍රික්කය—(සම්බන්ධයි)** | |
| අංක 5 තැබෑරුම, හැටන් | ඇම්. පර්නැන්ඩස් සහ ජී. ඇස්. පර්නැන්ඩස් මහතුන්, කස්ට්‍රෝ හෝටලය සහ පියිකාව, හැටන්<br>යූ. කේ. ඩී. යුබෝල්ට් මාසල් මහතා, ආර්මිස් හෝටලය සහ පියිකාව, හැටන්<br>රටබීම තැබෑරුම, අංක 6, දික්ඔය<br>රටබීම තැබෑරුම, අංක 7, දික්ඔය<br>ඕ. කේ. ඩී. ජේ. එතල්බර්ට්, ඕ. කේ. ඩී. ඇබ්ඩන් සහ ඕ. කේ. ඩී. විල්ප්‍රඩ් මහත්වරු, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, දික්ඔය<br>සීමාසහිත මිලර්ස් මහත්වරු, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, දික්ඔය<br>ටී. ඇක්ස්. ඒ. ලැනී මහතා, ක්‍රවුන් හෝටලය, හැටන්<br>ප්‍රැන්ක්ලන්ඩ් හෝටලය සහ පියිකාව, හැටන්<br>ඒ. සුබ්‍රමානියම් මහතා, ඉන්ද්‍රා හෝටලය, හැටන් |
| අංක 8 තැබෑරුම, මස්කෙළිය | ඒ. වී. කොස්තා මහතා, මස්කෙළිය හෝටලය සහ පියිකාව, මස්කෙළිය<br>ඒ. වී. කොස්තා මහතා, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, මස්කෙළිය |
| අංක 6 තැබෑරුම, කොටියාගල | ආර්. ඒ. ප්‍රනාන්දු මහතා, සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, බොගවන්තලාව<br>තානායම, බොගවන්තලාව |
| අංක 3 තැබෑරුම, වහුගපිටිය— | |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය** | |
| අංක 4 තැබෑරුම, බඹරකැලේ | කිංග්ස් හෝටලය, නුවරඑළිය<br>ප්‍රියෝරි හෝටලය, නුවරඑළිය<br>රටබීම ආපන ශාලාව, නුවරඑළිය<br>රටබීම තැබෑරුම, නුවරඑළිය<br>ජේඩ්ග හෝටලය සහ පියිකාව, නුවරඑළිය<br>ග්‍රැන්ඩ් හෝටලය සහ පියිකාව, නුවරඑළිය<br>වින්සර් හෝටලය සහ පියිකාව, නුවරඑළිය<br>ගෝස්වේනර් හෝටලය සහ පියිකාව, නුවරඑළිය<br>සීමාසහිත කාර්ගිල්ස් මහතුන්, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, නුවරඑළිය<br>සීමාසහිත මිලර්ස් මහත්වරු සහ සමාගම, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, නුවරඑළිය<br>ජේ. ඇල්. පිමන්ඩා, ටී. ඒ. ප්‍රනාන්දු සහ එච්. එච්. ප්‍රනාන්දු මහත්වරු, රටබීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, නුවරඑළිය<br>ඇම්. පීරිස් මහත්වරු, බීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, නුවරඑළිය |
| අංක 2 තැබෑරුම, පදියපැලැල්ල | කේ. ඇම්. ඩබ්. ප්‍රනාන්දු සහ කේ. පී. ටී. සිල්වා මහත්වරු, බීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව<br>තානායම, හඟුරන්කෙත, පදියපැලැල්ල |
| අංක 5 තැබෑරුම, රාගල | ඇම්. මෝතා සහ ඇම්. ඇල්. මෝතා මහත්වරු, බීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, රාගල |
| අංක 3 තැබෑරුම, හෝල් බෲක් | සීමාසහිත මෙල් මෙන්ඩිස් මහත්වරු, බීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, ආගරපතන |
| **බදුල්ල දිස්ත්‍රික්කය** | |
| අංක 1 තැබෑරුම, බදුල්ල | තානායම, බදුල්ල<br>ඇස්. ඇම්. මිරැන්ඩා සහ ජේ. ආර්. බී. වී. මිරැන්ඩා, ඌව හෝටලය සහ පියිකාව, බදුල්ල<br>රට බීම තැබෑරුම අංක 2, වෝඩ් වීදිය, අංක 5 දරණ මධ්‍ය කොට්ඨාශය, බදුල්ල<br>රට බීම තැබෑරුම අංක 3, බසාර් වීදිය, අංක 5 දරණ මධ්‍ය කොට්ඨාශය, බදුල්ල<br>ජේ. ඇම්. ඩී. පී. පෙරේරා, රටබීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, බසාර් වීදිය, බදුල්ල |
| **බදුල්ල දිස්ත්‍රික්කය—(සම්බන්ධයි)** | |
| අංක 4 තැබෑරුම, ලුනුගල | " ද ට්‍රෙඩිං ඇන්ඩ් ෆෝවඩිං ඒජන්සි ", රට බීම සාප්පුව, ලුනුගල<br>තානායම, ලුනුගල |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | |
| අංක 1 තැබෑරුම, බලන්ගොඩ | ඇෆ්. ඇල්. ගෝමස්, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, බලන්ගොඩ<br>තානායම, බලන්ගොඩ |
| **මඩකලපුව දිස්ත්‍රික්කය** | |
| අංක 3 තැබෑරුම, කොඩ්ඩෙයිමුනෝ | ඒ. වී. ප්‍රනාන්දු, කීන්ස් හෝටලය, කොඩ්ඩෙයිමුනෝ<br>වී. එම්. ජෝශප් සහ ආර්. පී. ඉග්නේෂස් නෝනා මහත්මියන්, සෙන්ට්‍රල් හෝටලය, පුලියන්තිවු<br>එස්. නඩරාසා නෝනා මහත්මිය, ග්‍රැන්ඩ් ඊස්ටන් හෝටලය, කොඩ්ඩෙයිමුනෝ<br>සී. කුරුනේරු, ලේක්විව් හෝටලය, මඩකලපුව<br>රට බීම තැබෑරුම, මඩකලපුව<br>සිවලිංගම් වෙට්ටියාර් මහත්වරු, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, කෙලින් වීදිය, පුලියන්තිවු<br>තානායම, මඩකලපුව |
| අංක 1 තැබෑරුම, වාලච්චේනෙයි | ... තානායම, කල්කුඩා |
| අංක 2 තැබෑරුම, එරාවූර් | ... තානායම, මහ ඔය |
| **අම්පාරෙයි දිස්ත්‍රික්කය** | |
| අංක 1 තැබෑරුම, පෙරියනිලාවනෙයි | ඇම්. ඇම්. සෙබස්තියන් සහ ඇම්. ජේ. එස්. සෙල්වරත්නම් නෝනා මහත්මියන්, එක්සෙල්සියෝර් සහ පියිකාව<br>තානායම, කල්මුනෙයි<br>වී. ඇම්. ජෝශප් සහ ආර්. පී. ඉග්නේෂස් නෝනා මහත්මියන්ගේ රට බීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, කල්මුනෙයි<br>තානායම, සින්නමුගන්තිවාරම්<br>තානායම, ඉහිනියාගල<br>තානායම, අරුමුගම්බේ |
| **ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය** | |
| අංක 1 තැබෑරුම, නෙවිල් වීදිය | ටුවරිස්ට් සෙන්ටර්, ජේද්‍රික් කොටුව, ත්‍රිකුණාමලය<br>ජේ. එල්. ආර්. ඒ. එස්. සහ එස්. එම්. මිරැන්ඩා මහත්වරු, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, ඩොක්යාර්ඩ් පාර, ත්‍රිකුණාමලය<br>ටී. ඒ. එම්. ප්‍රනාන්දු, මේස්ලන්ඩ් හෝටලය, ත්‍රිකුණාමලය<br>තානායම, මුතූර් |
| අංක 2 තැබෑරුම, සෙන්ට්‍රල් පාර | තානායම, ත්‍රිකුණාමලය (නගරයේ)<br>ඇස්. පාකියම් නෝනා මහත්මිය, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, ට්‍රිංකො ස්ටෝර්ස්, ඩොක් යාර්ඩ් පාර, ත්‍රිකුණාමලය<br>තානායම, කන්තලේ<br>ඇස්. වල්ලිපුරම්, වෙල්කොම්බ් හෝටලය, ත්‍රිකුණාමලය<br>වී. කේ. චින්නයියා මයි., කින්ස්ග් හොටෙල්<br>බී. නෙමිනාතන් මයි., මැන්ෂන් හොටෙල් |

| (1)<br>අරක්කු තැබෑරුමේ අංකය සහ නම | (2)<br>වෙන් කරන ලද රට බීම ස්ථානය |
|---|---|
| | **අනුරාධපුර දිස්ත්‍රික්කය** |
| අංක 1 තැබෑරුම, අනුරාධපුරය | ඇම්. ඒ. මෝවසම්, ගෙස්ට් හවුස්<br>ජේ. ඩී. වික්ටර්, සෙන්ට්‍රල් හෝටලය, අනුරාධපුරය<br>සීමාසහිත ජේ. ඇම්. ඇස්. මිරැන්ඩා සහ පුත්‍රයෝ, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, අනුරාධපුරය<br>ජේ. දෙන් වික්ටර්, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, අනුරාධ පුරය<br>දුම්රිය ආපන ශාලාව, අනුරාධපුරය<br>තානායම, මැදවච්චිය<br>තානායම, හබරන<br>තානායම, හොරවුපොතාන<br>තානායම, කහටගස්දිගිලිය<br>තානායම, නුවරවැව |
| | **කුරුණෑගල දිස්ත්‍රික්කය** |
| අංක 4 තැබෑරුම, කුරුණෑගල | ඇස්. ප්‍රනාන්දු සහ එම් වැන්ලැන්ගන්බර්ග් නෝනා මහත්මිය, 58, එස්ප්ලනේඩ් පාර, කුරුණෑගල<br>ජේ. ගොන්සාල් සහ ජේ. ඇල්. ගොන්සාල් මහත්වරු, 6, එස්ප්ලනේඩ් පාර, කුරුණෑගල<br>ඇම්. ඇල්. එච්. මිරැන්ඩා සහ ජේ. ටී. පී. ආර්. මිරැන්ඩා මහත්වරු, 176, නුවර පාර, කුරුණෑගල<br>ෆ්‍රෙඩරික් ගිල්බට් මහතා සහ ජී. ගොන් සාල් නෝනා මහත්මිය, 22, සාන්ත ආනා වීදිය, කුරුණෑගල<br>සී. පල්ඩානෝ මහතා, 35, පුත්තලම පාර, කුරුණෑගල |
| අංක 4 තැබෑරුම, කුරුණෑගල | පී. බී. බෘනෝ මහතා සහ පී. ඩී. ඊ. හෙඩ්වික් නෝනා මහත්මිය, ග්‍රෑන්ඩ් හෝටලය, කුරුණෑගල<br>තානායම, කුරුණෑගල |
| අංක 7 තැබෑරුම, නාරම්මල ... | තානායම, නාරම්මල |
| අංක 3 තැබෑරුම, යක්විල ... | තානායම, කුලියාපිටිය |
| | **යාපනය දිස්ත්‍රික්කය** |
| අංක 1 තැබෑරුම, ග්‍රෑන්ඩ් බසාර් | ඇස්. ඇෆ්. ඇක්ස්. අනසාමිපුල්ලේ මහතා, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, 31, කෙලින් වීදිය, යාපනය<br>ඇස්. පී. නඩරාජා මහතා, ද ජෆ්නා ඇපොතිකරීස් සමාගම, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, යාපනය<br>පී. සුප්පයියා නෝනා මහත්මිය, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, කස්තූරියර් පාර, යාපනය<br>පී. සුප්පයියා නෝනා මහත්මිය, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, කෙළින් වීදිය, යාපනය<br>වේලුපුල්ලේ නෝනා මහත්මිය, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, යාපනය<br>වී. තුරෙයිඅප්පා මහතා, ග්‍රෑන්ඩ් හෝටලය, සහ පියීකාට, යාපනය<br>ඇම්. මධාවන් මහතා සහ රාජසුන්දරී මධාවන් නෝනා මහත්මිය, කොළඹ ආපන ශාලාව, කස්තූරියර් පාර, යාපනය<br>තානායම, යාපනය<br>යෝල්ටා හෝටලය, යාපනය<br>තානායම, කන්කසන්තුරේ<br>තානායම, චාවාකච්චේරි |
| | **යාපනය දිස්ත්‍රික්කය—සම්බන්ධයි** |
| අංක 4 තැබෑරුම, කයිට්ස් ... | තානායම, කයිට්ස් |
| අංක 3 තැබෑරුම, වෙල්වෙට්තුරේ ... | තානායම, පේදුරුතුඩුව |
| | **මන්නාරම් දිස්ත්‍රික්කය** |
| අංක 1 තැබෑරුම, මන්නාරම | රට බීම තැබෑරුම, මන්නාරම<br>කේ. ඇලෙක්ස් පෙරේරා මහතා, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, මන්නාරම<br>තානායම, මන්නාරම |
| | **වවුනියා දිස්ත්‍රික්කය** |
| අංක 1 තැබෑරුම, මුලතිව් ... | තානායම, මුලතිව් |
| අංක 2 තැබෑරුම, මාන්කුලම් ... | තානායම, මාන්කුලම් |
| අංක 3 තැබෑරුම, වවුනියාව | එම්පයර් හෝටලය, වවුනියාව<br>තානායම, වවුනියාව<br>වී. සබාරත්නම් මහතා, සිල්ලරට බීම විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, වවුනියාව |
| | **කළුතර දිස්ත්‍රික්කය** |
| අංක 5 තැබෑරුම, නල්ලූරුව ... | තානායම, හොරණ |
| අංක 1 කලමුල්ල | තානායම, මතුගම<br>තානායම, කළුතර |
| අංක 3 බේරුවල | තානායම, මොරගල<br>තානායම, බෙන්තොට |
| | **ගාලු දිස්ත්‍රික්කය** |
| අංක 1 තැබෑරුම කටුගොඩ | තානායම, හික්කඩුව<br>තානායම, අම්බලන්ගොඩ<br>තානායම, හිනිදුම<br>තානායම, උඩුගම |
| | **මාතර දිස්ත්‍රික්කය** |
| අංක 1 කටුගොඩ | තානායම, දෙනියාය<br>තානායම, අකුරැස්ස |
| අංක 2 හීනැටිගල | තානායම, වැලිගම<br>තානායම, මාතර |
| | **හම්බන්තොට දිස්ත්‍රික්කය** |
| අංක 1 තැබෑරුම, හම්බන්තොට | එච්. එච්. රනවීර නෝනා මහත්මියගේ රට බීම සිල්ලරට විකුණන (ඉවත ගෙන යාමට) සාප්පුව, හම්බන්තොට<br>තානායම, වලස්මුල්ල<br>තානායම, තංගල්ල<br>තානායම, අම්බලන්තොට<br>තානායම, හම්බන්තොට<br>තානායම, තිස්සමහාරාමය |

4—476

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඵුවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1970**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| මාර්තු | 70. 3. 5 බ්‍රහස්පතින්ද | 70. 2.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | 70. 3.13 සිකුරාද | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 3.20 සිකුරාද | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්ද | 70. 3 19 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | 70. 4. 3 සිකුරාද | 70. 3.25 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.10 සිකුරාද | 70. 4. 3 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.17 සිකුරාද | 70. 4. 8 බදාද | ප.ව. | 3.30 |
| | 70. 4.24 සිකුරාද | 70. 4.17 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්ද | 70. 4.23 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මැයි | 70. 5. 8 සිකුරාද | 70. 4.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 5.15 සිකුරාද | 70. 5. 8 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.22 සිකුරාද | 70. 5.15 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 5.29 සිකුරාද | 70. 5.22 සිකුරාද | ප.ව. | 3.30 |
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |

1970 මාර්තු 5 වැනි දින.
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.